**2026.07.14 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 ජූලි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගීත්වය :-

| | | | |
|---|---|---|---|
| 1. | ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා | - | ගරු සභාපති |
| 2. | ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා | - | ගරු උප සභාපති |
| 3. | කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 4. | පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 5. | ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 6. | ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 7. | ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 8. | උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 9. | ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. | එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. | මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. | එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. | සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. | ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. | කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 16. | නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 17. | ලියනගමගේ අභයරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. | එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 19. | යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 20. | බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 21. | ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

සහභාගී නොවූ :-

| | | | |
|---|---|---|---|
| 1. | ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 2. | ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප

කොඩිතුවක්කු මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය හා ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා යන මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරුන් ද, ප්‍රාදේශීය සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම :-**

1.1. 2026.06.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

2026.06.09 දින පැවති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සභිකයින් වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.40 ට ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**<u>සංශෝධන අංක 01 - ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන:-</u>**

පසුගිය සභා වාරයේ ගරු සභාපතිතුමාගේ කල් නොදුන් යෝජනා යටතේ 5.10.6 හි ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවල අංක 20 ඇස්තමේන්තුව "සිංහරූපාගම, සුද්ධගොඩ ප්‍රධාන මාර්ගයේ දිලිප් මහතාගේ නිවස යාබද වමට ඇති මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට හේමන්ත මහතාගේ මහගෙදර දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම" ලෙස සංශෝධනය විය යුතුයි.

ඉහත සංශෝධනයට යටත්ව 2026.06.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-** කිසිවක් නැත

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-** කිසිවක් නැත

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-** කිසිවක් නැත

**5. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**5.1. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.1.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ අවසන් ගිණුම තුළ දීර්ඝ කාලයක් තිස්සේ පවතින විගණන කටයුතු සඳහා ද නිරන්තරයෙන් ලක්වන පහත කර්මාන්ත ණය හිමියන් අවසන් ගිණුම් තුළින් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

1. කැකිරිගත්හේන - මඩකුඹුර හරස් මාර්ගය බැකෝ යන්ත්‍රය යොදවා ප්‍රතිසංස්කරණය කිරීම - (රු. 88,000/-)
2. හබුරුගල මුණසිංහ ජනපදය ඇතුංගාගොඩ මාර්ගය සංවර්ධනය කිරීම - (රු. 69,541.55)
3. බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථානවල පුවරු සවි කිරීම - (රු. 173,519/-)
4. වතුර ටැංකි 06 ක් මිල දී ගැනීම හා වතුර ටැංකි රඳවන 06 ක් ඉදි කිරීමේ කර්මාන්තය (රු. 4,155/-)

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.43 ට ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මෙම මුදල් මීට වසර ගණනාවකට පෙර සිදු කළ කර්මානතයන්වල ගිවිසුම්ගත වීමේ දී සිදු වූ අඩුපාඩු, කර්මාන්තය අවසන් නොකිරීම, අවසන් කළ ද එය නිසි පරිදි සිදු නොකිරීම අදී වූ විවිධ අඩුපාඩු හේතුවෙන් ගෙවා අවසන් නොකොට ණය හිමියන් ලෙස දිගින් දිගටම අවසන් ගිණුම් තුළ පැවත එන බවත්, මෙම මුදල් ලබා ගැනීමට මෙතෙක් කිසිදු ආයතනයක් ඉල්ලීම් සිදු කර නොමැති බවත්, සභා කාලය විසුරුවා හැරීමට ආසන්න කාලයේ දී පෙර සිටි සභාපතිවරුන් හදිසියේ ගෙන්වන ලද නමුත් වැඩ ආරම්භ නොකළ කර්මාන්තයන්වල භාණ්ඩවලට අදාළ මුදල් ද මේ අතර තිබෙන බවත්, විගණනයෙන් නිරන්තර මෙම ණය හිමියන් පිළිබඳ විමසන බැවින් මෙම ණය හිමියන් අවසන් ගිණුම් තුළින් ඉවත් කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2. ආයතනයේ එදිනෙදා කටයුතු සිදු කිරීමේ දී සිදුවන දුෂ්කරතාවයන් මඟහැර ගැනීම සඳහා නව ලැප්ටොප් පරිගණක 01 ක් සහ ඩෙස්ක්ටොප් පරිගණක 03 ක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
ආයතනයේ එදිනෙදා වැඩ කටයුතුවල පහසුව වෙනුවෙන් නව පරිගණක කිහිපයක් ලබා ගැනීමට අවශ්‍යව පවතින බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.3. 2026 ජාතික කියවීම් මාසය වෙනුවෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විද්‍යාලවල සිසුසිසුවියන් අතර සාහිත්‍ය තරඟාවලියක් පැවැත්වීමටත්, ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය සහ අවසාන දින ප්‍රවීණ සම්පත්දායකයෙකු මඟින් සිදු කරන සාහිත්‍ය දේශනයක් සහිත සාහිත්‍ය උත්වසයක් පැවැත්වීමටත්, ඒ වෙනුවෙන් සභා අරමුදලින් රු. 650,000/- ක වැය බරක් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
සෑම වර්ෂයක් පාසාම කියවීම් මාසය වෙනුවෙන් අප සභාව විසින් සාහිත්‍ය තරඟාවලියන් පවත්වා ඒ මඟින් දරුවන්ගේ කුසලතා එළි දැක්වීමට අවස්ථාව ලබා දීම වගේම එම කුසලතා අගයමින් කුඩා තිළිණ ලබා දීමක් සිදු කරන බවත්, ඔක්තෝම්බර් මාසයේ යෙදෙන මෙම වැඩසටහන සඳහා සභා අරමුදලින් රු. 650,000/- ක වියදමක් දැරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.4. ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය අනුව වැඩ ක්ෂේත්‍ර කම්කරු පුරප්පාඩු 02 ක් සහ සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු 01 ක් ලෙස කම්කරු පුරප්පාඩු 03 ක් පවතී. දෛනිකව ප්‍රාදේශීය සභාවේ රාජකාරී ඉටු කිරීමට මෙම පුරප්පාඩු පැවතීම ඉතා අහිතකර ලෙස බලපා ඇත. එබැවින් ස්ථිර පදනමින් සේවකයින් බඳවාගන්නා තුරු PL - I වැටුප් පරිමාණය ප්‍රකාරව රු. 1,888.77 ක දෛනික වැටුපක් සභා අරමුදලින් ගෙවීමට යටත්ව එකී පුරප්පාඩු කම්කරු තනතුරු 03 සඳහා ආදේශක පදනමින් සේවකයින් යොදවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.50 ට ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා හා ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මෙම සභාවේ සේවය කළ කම්කරුවන් කීප දෙනෙකු විශ්‍රාම යාම, මිය යාම, සේවය අතහැර යෑම ආදිය හේතුවෙන් මේ වන විට ඇති වී තිබෙන පුරප්පාඩු සඳහා කසල අංගනයේ කසල තේරීම් කටයුතු සිදු කරන කාන්තාවන් දෙදෙනා ද සමඟ 6 දෙනෙකුගේ සේවය ලබා ගනිමින් පවතින බවත්, එම එක් අයෙකු සඳහා

දිනකට රු. 3,000/- ක පමණ මුදලක් ලබා දිය යුතු බැවින් එය සභාවට විශාල වැය බරක් වන බවත්, අප ප්‍රදේශය සංචාරක පුරවරයක් බැවින් මේ ආකාරයට හෝ සේවාවන් පවත්වා ගෙන යාම සඳහා එම සේවක සංඛ්‍යාවේ දායකත්වය අත්‍යාවශ්‍ය වන බවත්, සේවකයන් 10 දෙනෙකුගේ පමණ අවශ්‍යතාවයක් පැවතෙන නමුත් පුරප්පාඩු 04 ක් පමණක් පවතින බැවින් එම 04 සඳහා ආදේශක පදනමින් 04 දෙනෙකු ලබා ගැනීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.5. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2026 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සඳහා අවමංගල්‍යාගාරයක් ඉදි කිරීමට මිලියන 07 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට වැඩ නිමකර ගැනීම සඳහා පළාත් සභාව ලබා දෙන ප්‍රතිපාදනවලට අමතරව තවදුරටත් අවශ්‍ය වන ඇස්තමේන්තුගත අතිරේක ප්‍රතිපාදන සභා අරමුදලින් යෙදවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

අවමංගල්‍ය ශාලාවක් ද සෑදීමේ අදහසක් තිබූ නමුත් ඒ සඳහා තවත් ගැඹුරින් අධ්‍යනයක් සිදු කළ යුතු නිසා අවමංගල්‍යාගාරයක් පමණක් සකස් කිරීමට යෝජනා කළ බවත්, ඒ සඳහා පළාත් නිශ්චිත ප්‍රතිපාදන මඟින් රු. මිලියන 7 ක මුදලක් ලැබෙන බවත්, වැඩ සම්පූර්ණයෙන් අවසන් නොකොට තට්ටු 2 ට සකස් කිරීමට පමණක් ලක්ෂ 280 ක පමණ මුදලක් වැයවන බවත්, ඉතිරි ලක්ෂ 210 ක මුදල සභා අරමුදලින් දැරිය යුතු වන බැවින් ඒතරම් විශාල මුදලක් අප සභාවට දැරිය නොහැකි නිසා නැවත තනි තට්ටුවට සකස් කිරීමට සංශෝධනය කළ බවත්, ඒ සඳහා ද ලක්ෂ 140 කට ආසන්න මුදලක් වැය වන බවත්, මෙම මුදල ද සම්පූර්ණ වැඩය නිම නොකර බිත්ති බැඳ වහලය තෙක් නිම කිරීමට පමණක් බවත්, ඉතිරි ලක්ෂ 70 ක පමණ මුදල සභා අරමුදලින් දැරිය යුතු වන බවත්, මේ වන විට ටෙන්ඩර් දැන්වීම් පුවත්පත්වල පළකර තිබෙන අතර මේ මාසය අවසන් වීමට පෙර එහි වැඩකටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්, එවිට මේ වර්ෂය අවසාන වන විට එහි අවසානයක් කරා ළඟා වීමට හැකි වන බවත්, ඉතිරි ලක්ෂ 70 ක පමණ මුදල සභා අරමුදලින් දැරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.6. රන්තොටුවිල හිවත්තගොඩ මාර්ගයේ කොටසක් තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
පසුගිය මස සභාවක දී මොරගොඩ ප්‍රදේශයට ද ලක්ෂ 15 ක ප්‍රතිපාදන වෙන් කළ බවත්, මෙම මාර්ගය ද එම ආසන්නයේම පවතින බවත්, මෙහි ආරම්භක මීටර් 100 ක පමණ ප්‍රමාණය සංවර්ධනය කළයුතු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.2. <u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.2.1. ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ ඇලකාක නිල සෙවන කාර්යාලය සහිත මාර්ගයේ නිල සෙවන දක්වා කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>**
එම ස්ථානය නිරීක්ෂණය කළ අවස්ථාවේ දී දැඩි ලෙස මඩවී තිබූ බවත්, මීට පෙර ABC දමා තිබූ මීටර් 100 ක පමණ මාර්ග කොටසක් වන බවත්, එය කොන්ක්‍රීට් කර දීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2. ඇතුංගාගොඩ ග්‍රාම නිලධාරී වසමේ රණවිරු අජිත් තුෂාර මාවතේ වැසි ජලය බැස යාමට පැති කාණුව කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>**
මෙම මාර්ගය ද නිරීක්ෂණය කළ අවස්ථාවේ පාර පුරා ජලය රැඳී තිබූ බවත්, එම ජලය වත්තක් මැදින් ගලාගෙන යන බවත්, ඒ හේතුවෙන් පැති කාණුව කොන්ක්‍රීට් කර සකස් කර දීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.3. <u>ගරු මන්ත්‍රී, රංජිත් උඩබේසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.3.1. මාර්ග සංවර්ධන අධිකාරියේ ගාලු පාර හා ඇල්පිටිය පාර සම්බන්ධ කරන විකල්ප මාර්ගය වන දෝපේ කොට්ඨාසයේ, වරාහේන ග්‍රාම නිලධාරී වසමට හා දෝපේ වසමට මායිම් වූ මීටර් 2030 ක් පමණ වූ

අල්විස් පාර දීර්ඝ කාලයක සිට නඩත්තු නොවූ මාර්ගයකි. මෙහි අබලන් වී ඇති ස්ථාන කීපයක් පෙරමුසු යොදා අලුත්වැඩියා කිරීම හා මාර්ගය දෙපස කාණු පද්ධතිය ශුද්ධ කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

__ගරු මන්ත්‍රී, රංජිත් උබේසිංහ මැතිතුමා__
මෙම මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණයට වේල්ල කොටසක් ද පවතින බවත්, ආරම්භයේ සිට අවසානය දක්වා මාර්ගය දෙපසම පවතින කාණු පද්ධතිය මේ වන විට වල් බිහි වී ඇති බවත්, මීට අමතරව මාර්ගයේ ස්ථාන කිහිපයක් අබලන් වී ඇති බවත්, විකල්ප මාර්ගයක් ලෙස බහුලව මෙම මාර්ගය භාවිත වන බැවින් මෙම මාර්ගය සකස් කර දීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
පළමුව වැඩ පරිපාලක මහතා සමඟ සාකච්ඡා කොට කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සිදු කර ගන්නා ලෙසත්, පෙරමුසු ලැබුණු පසු එම මාර්ගය සකස් කිරීමේ කටයුතු සිදු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.3.2. ප්‍රදේශයේ ජනතාව පරිභෝජනය කර ඉවත ලන ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය (E - Waste) බැහැර කිරීමේ ගැටලුවක් තිබෙන බවට මහජන පැමිණිලි ලැබෙන අතර මේ සඳහා යම් කාල පරාසයක් තුළ අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානයක් (E – Waste Collection Center) ඇති කර සුදුසු පියවරක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

__ගරු මන්ත්‍රී, රංජිත් උබේසිංහ මැතිතුමා__
සභාවේ කසල ට්‍රැක්ටර්වලට මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ලබා නොගන්නා අතර පරිසරයට බැහැර කිරීමට ද නොහැකි බවත්, මීට පෙර එක් අවස්ථාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඉලෙක්ට්‍රොනික උපකරණ එකතු කිරීමේ ජංගම මධ්‍යස්ථානයක් පවත්වා අවසානයේ එම එකතු වූ ද්‍රව්‍ය ඒවා එකතු කරන මධ්‍යස්ථානයකට ලබා දුන් බවත්, අප විසින් ද මේ සඳහා යම් වැඩපිළිවෙළක් සකස් කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදි.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
පරිසර අමාත්‍යාංශයෙන් වසරකට එක් වතාවක් පමණ ඉලෙක්ට්‍රොනික උපකරණ එකතු කිරීමේ වැඩසටහනක් පවත්වන බවත්, එහි දැනුම් දීමක් මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඒවා එකතු කිරීමේ ජංගම කුටියක් පැවැත්වූ බවත්, කසල සම්බන්ධව ගාල්ලේ පැවැත්වූ රැස්වීමක දී සියලුම ආකාරයේ කසල ලබා ගන්නා ආයතනයක් පිළිබඳ දැනුවත් වූ බවත්, මේ වන විට එම ආයතනය අම්බලන්ගොඩ නගර සභාවේ කසල ලබා ගන්නා බවත්, එක් එක් සභාවට වෙන වෙනම පැමිණීමේ ප්‍රායෝගික ගැටලු හේතුවෙන් ආණ්ඩුකාරතුමන් සමඟ සාකච්ඡා කොට සියලුම සභාවලට එක් දිනක් වෙන් කොට පැමිණීමට කටයුතු

කරන බව දැන්වූ බවත්, එම ආයතනය ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ද ලබා ගන්නේ නම් එම ආයතනය පැමිණීමට සතියකට පමණ පෙර සිට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ ජංගම කුටියක් ආරම්භ කිරීමට හැකි බවත්, එසේ නොමැති නම් පරිසර අමාත්‍යාංශය මඟින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමට පැමිණෙන්නේ නම් එම ආයතනයට ලබා දීමට හැකි බවත්, එසේ නොමැතිව ඒවා එකතු කර රැස් කර තබා ගැනීම අප ආයතනයට ගැටලුවක් වන බවත්, කසල එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සකස් කිරීම සඳහා පැවති රැස්වීම් ගණනාවක දීම භූමියක් ලබා දෙන ලෙස ඉල්ලීම් කළ ද මෙතෙක් එය ඉටු කර නොදුන් බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.4. <u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා:-</u>**

5.4.1. බෙන්තොට යාත්‍රාමුල්ල කොට්ඨාසයේ සිංහරූපාගම සුගත වැඩිහිටි නිවාස පාරේ ජනක මහතාගේ කඩය අසලින් ගෙවල් 5 කට පමණ යන මීටර් 40 ක් පමණ වන පාර මඩවී යාමට නොහැකි අන්දමින් අබලන් වී ඇති බැවින් එම මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.2. බෙන්තොට යාත්‍රාමුල්ල කොට්ඨාසයේ පිටාරඹ ජාතික නිවාස ප්‍රදේශයේ ගුණසේන කාලඹආරච්චි මහතාගේ නිවස අසල සිට ස්වේ අරුණ විලා (බන්දු මහතාගේ නිවස) දක්වා නිවාස 10 ක් පමණ ඇති අතර ඉන් 8 ක පමණ “විලා” පවත්වාගෙන යයි. මෙම මාර්ගය දැඩිලෙස අබලන් තත්ත්වයේ පවතින අතර මෙහි පැමිණෙන සංචාරකයින්ට මෙම මාර්ගයේ ගමන් කිරීම හා වාහන ගමන් කිරීම ද ඉතා අපහසු වී ඇත. දිගින් මීටර් 75 ක් පමණ වන මෙම මාර්ගය කඩිනමින් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>**
හතරමං හන්දියේ සිට ජාතික නිවාස මාර්ගයේ ඉදිරියට මෙම මීටර් 75 ක පමණ කොටස පවතින බවත්, එම මාර්ගය සකස් කර දෙන මෙන් ප්‍රදේශවාසීන්ගේ දැඩි ඉල්ලීමක් තිබෙන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.5. <u>ගරු මන්ත්‍රී, රුසිත නන්දන තුෂාර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.5.1. දීර්ඝ කාලීනව අබලන් තත්ත්වයේ පවතින 11 - බී, ගල්තුඩුව, බුංගෙඩිය පාර මීටර් 150 ක පමණ ප්‍රමාණය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සුදුසු බවත්, එම මාර්ගයේ පවතින අසංක නල්ලප්පෙරුම මහතාගේ ඉඩම මායිමේ පිහිටා ඇති අති විශාල මහෝගනී ගස් පේළිය මේ සඳහා බාධාවක් වී ඇති හෙයින් සභාව සතු බලතල ප්‍රකාරව ඒවා ඉවත් කර දීම සුදුසු බවත් යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රුසිත නන්දන තුෂාර මැතිතුමා</u>

මෙම මාර්ගයේ කොටසක මාර්ගයේ පසෙකින් මහෝගනී ගස් 10 ක් පමණ හා තවත් ගස් කිහිපයක් තිබෙන බවත්, එම ගස් ඉවත් නොකොට මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම කළ නොහැකි බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ සේවා නිලධාරී විසින් ද මෙම මාර්ගය නිරීක්ෂණය සඳහා පැමිණි බවත්, එම නිවැසියන් මේ වන විට එහි පදිංචිව නොසිටින නමුත් ඡන්ද නාමලේඛනයේ තවමත් නම් සඳහන් වන බවත්, ගස් ඉවත් කර දෙන ලෙස කළ ඉල්ලීමට ඔවුන්ගේ අකමැත්තක් නොමැති නමුත් එකවර ගස් සියල්ල ඉවත් කිරීමට ක්‍රමයක් නොමැති බවත්, එම ගස් ඉවත් කර පැති බැම්මක් බැඳ දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලීමක් කර ඇති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

එම මාර්ගය මීට පෙර කොන්ක්‍රීට් කරන ලද්දේ මීට අවුරුදු 18 කටත් පෙර වන බවත්, ඒ වන විට ද එම ගස් කුඩා පැළ ලෙස පැවති අතර මේ වන විට ගස් විශාල වී ඒවායේ මුල් නිසා මාර්ගයේ කොන්ක්‍රීට් තට්ටුව ගැලවී යන තත්ත්වයට පත්ව ඇති බවත්, පුද්ගලික ඉඩමකට පැති බැම්මක් බැඳීමට සභාවට හැකියාවක් නොමැති බවත්, එම නිවැසියන්ගෙන් පුද්ගලිකවම ඉල්ලීමක් සිදු කර එම ගස් ඉවත් කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.6. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>

5.6.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගෝනගලපුර සතිපොළ පරිශ්‍රයේ පිහිටා ඇති පොදු වෙළඳපොළ ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමරයක් 2022 වර්ෂයේ දෙසැම්බර් මස සිට ලංකා බැංකුව සඳහා ස්වයංක්‍රීය මුදල් හුවමාරු යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට ලබා දී ඇත. එකී බැංකුව සමඟ ගිවිසුම්ගත වීමක් සිදු කර නොමැති බැවින් මෙම යෝජනාවේම කොටසක් ලෙස සලකා ඉදිරිපත් කරනු ලබන උපලේඛන අංක 01 ආකෘතියේ ප්‍රකාරව ලංකා බැංකුව සමඟ ගිවිසුමකට එළැඹීම සුදුසු බවටත්, එකී බදු ගිවිසුම 2022.12.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 03 කට වරක් යාවත්කාලීන කිරීමට යටත්ව සහ මාසික බදු කුළිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව රු. 12,000/- ක් ලෙස අය කිරීම සුදුසු බවටත්, කඩකාමරයේ එක්වන් මුදල රු. 1,200,000/- ක් ලෙස තීරණය කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙය ඉතා කඩිනමින් සිදු වූවක් බවත්, කොරෝනා කාලයේ දී පිටරටින් බඩු ගෙන ඒම සීමා වූ අවස්ථාවේ දී මෙම යෝජනාව පැමිණි බවත්, ඒ අවස්ථාවේ දී දකුණු පළාත භාර ලංකා බැංකු මහ කළමනාකාරතුමිය විසින් ATM හා CDM පහසුකම් 02 ම සහිත එක මැෂින් එකක් පමණක් රට තුළ ඒ අවස්ථාවේ පවතින බවට පැවසූ අතර, කොරෝනා වසංගත තත්ත්වය මත නැවත එවැනි යන්ත්‍රයක් ලංකාවට ගෙන ඒම පිළිබඳ නිශ්චිත කාලවකවාණුවක් සිතිය නොහැකි තත්ත්වයක් තිබූ නිසා කඩිනමින් එම යන්ත්‍රය අප සභාව වෙත ලබා ගෙන සති දෙකක පමණ කාලයක් ඇතුළත ගොඩනැගිල්ලේ එම යන්ත්‍රය සකස් කිරීමට අවශ්‍ය කොටස කඩිනමින් සකස් කොට යන්ත්‍රය ස්ථාපිත කිරීමට කටයුතු කළ බවත්, නමුත් එම අවස්ථාවේ ගිවිසුමක් අත්සන් කිරීමක් සිදු නොවූ බවත්, ඒ නිසා මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කොට ගිවිසුම්ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.2. ප්‍රාදේශීය සභාවේ පැරණි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාලු කොළඹ මහා මාර්ගයට ආසන්නව පිහිටා ඇති පොදු ළිඳ වසර ගණනාවකින් භාවිතයට නොගන්නා අතර මේ වන විට ගරා වැටීමෙන් හා කැළෑව වැවීමෙන් අත්හැර දමා ඇත. මදුරුවන් බෝවීමේ අවධානමක් ද පවතී. තව ද ගාලු කොළඹ මහා මාර්ගයට ඉතා ආසන්නව පිහිටා තිබීම නිසා දැඩි අනතුරුදායක තත්ත්වයක් ද පවතී. එබැවින් ගරා වැටීමෙන් අතහැර දමා ඇති එම ළිඳ පුරවා වසා දැමීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම ළිඳ පසුගිය දිනක නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේ එය ඉතාම අශෝභන මට්ටමේ පැවති බවත්, දිනක් පාරේ ගමන් ගත් වාහනයක් පාරෙන් පිටට පැන එම ළිඳ කඩාගෙන ගොස් තිබූ බවත්, ඉන්පසු ආරක්ෂාව සඳහා ඉනි වැටක් සකස් කළ අතර එම ඇල්බීසියා ඉනි වැට එම ස්ථානයේ වැඩී කැළයක් බවට පත් වී තිබූ බවත්, මෙම ළිඳේ ඩෙංගු බෝවීමේ අවධානමක් පවතින බැවින් කඩිනමින් එම ළිඳ වසා දැමීමට කටයුතු කිරීම සුදුසු වන බවත්, මාර්ගයට ඉතා ආසන්නයේ පැවතීම නිසා ප්‍රදේශවාසීන් එම ළිඳ භාවිතයට නොගන්නා බැවින් නැවත පරිහරණය කිරීමට එය සකස් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.3. ප්‍රාදේශීය සභාවේ පරිගණක හා තොරතුරු තාක්ෂණය සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාලවල න්‍යායාත්මක පුහුණුව ලැබ ප්‍රායෝගික පුහුණුව සඳහා මාස 06 ක කාලයකට ප්‍රාදේශීය සභාවට බඳවා ගනු ලැබූ ශිෂ්‍යාවන් දෙදෙනාගේ පුහුණු කාලය නිමවී ඇති බැවින් බල ප්‍රදේශයේ එවැනි සිසුන්ට අවස්ථාවන් ලබා දීම සහ ප්‍රාදේශීය සභාවේ රාජකාරී අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමේ හැකියාව ද සලකා කළුතර කාර්මික විද්‍යාලයේ පුහුණුව ලැබූ එම්. ඩී. චතුමි දිව්‍යාංජලී දිසානායක (ජා.හැ.අ. 200673403340) හා බලපිටිය කාර්මික විද්‍යාලයේ පුහුණුව ලැබූ කේ. එල්. අමේෂ් ප්‍රියශාන් (ජා.හැ.අ. 200611703205) යන

සිසුන් දෙදෙනා සඳහා මාස 06 ක ප්‍රායෝගික පුහුණු අවස්ථාවක් ලබා දීමටත්, ඒ වෙනුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2017 ප්‍රකාරව එක් අයෙකුට දිනකට රු. 1,000/- ක පුහුණු දීමනාවක් බැගින් ගෙවීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙතෙක් අප ආයතනයේ පුහුණුව ලැබූ සිසුවියන් දෙදෙනාගේ පුහුණු කාලය මේ මාසයෙන් අවසන් වූ බැවින් ද, අලුතින් එම පුහුණුව ලබා ගැනිමට සිසුන් දෙදෙනෙකු ඉල්ලීම් සිදු කර තිබූ බැවින් ද, ආයතනයේ කටයුතුවල පහසුව සඳහා ද එම සිසුන් දෙදෙනා බඳවා ගැනීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.4. ඇලකාක ප්‍රජා ශාලාවේ පිවිසුම් මාර්ගය (මාලගොඩවත්ත පාර) දැඩි ලෙස අබලන්ව ඇති බැවින් ABC කියුබ් 02 ක් දමා සභාවේ කම්කරුවන් යොදවා තාවකාලිකව එම මාර්ගය සකස් කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

එම ස්ථානයේ නිරීක්ෂණයකට ගිය බවත්, ලොකු ප්‍රජා ශාලාවක රජයේ නිලධාරීන් සියලු දෙනා කටයුතු සිදු කරගෙන යන බවත්, එම මාර්ගයට ABC දමා සකස් කර දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.5. ගලගම ග්‍රාම නිලධාරී වසමේ ප්‍රජා ජල ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා තෝරා ගත් ප්‍රජා ශාලා ඉඩමේ අයිතිය පිළිබඳ නීතිමය හා පරිපාලනමය ගැටලු ඇති බව අනාවරණය වූ අතර දෙවන තේරීම වූ ගලගම පන්සල් භූමියේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් සිදු කළ මූලික ජල පරීක්ෂාවන් අනුව ඉඩමේ ප්‍රමාණවත් ජල විභවතාවක් නොමැති බව අනාවරණය වූ බැවින් මෙතෙක් ජල සම්පාදන මණ්ඩලය වෙතින් ජල සබඳතා ලබා දී නොමැති ජල අවශ්‍යතාවය ඇති පවුල් සඳහා ඇටවල දංවත්ත ප්‍රදේශයේ නළ ළිඳ ඉදි කිරීම හා ජලය බෙදා හැරීමේ ව්‍යාපෘතිය අනුමත රු. මිලියන 02 ක ප්‍රතිපාදන මුදලින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ගලගම ප්‍රදේශයේ මෙම ජල ව්‍යාපෘතිය සඳහා ස්ථාන 02 ක්ම පරීක්ෂා කළ බවත්, ඉන් පළමු වැන්න වූ යෝජනාව ඉදිරිපත් කළ ස්ථානය අප සභාව සතු භූමියක් නොවූ බැවින් එහි මෙම ව්‍යාපෘතිය ඉදි කිරීමට

අරමුදල් වෙන් කිරීමට සභාවට හැකියාවක් නොපවතින බවත්, එම ස්ථානයේ එය ඉදි කිරීමට මහජන විරෝධයක් ද ඇති වූ බවත්, ගලගම පන්සල් භූමිය දෙවනුව පරීක්ෂා කළ නමුත් එම ස්ථානයට නළ ළිඳ සකස් කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර රැගෙන යාමට නොහැකි තත්ත්වයක් මතු වූ බවත්, ගලගම ප්‍රජා ශාලාවේ එම ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් ද සහභාගී කරවාගෙන රැස්වීමක් පවත්වා නළ ළිඳ ඉදි කිරීමට භූමි කොටසක් ලබා ගැනීමට සාකච්ඡාවක් තැබූ නමුත් ඉඩම් කොටසක් ලබා දීමට කිසිවෙක් ඉදිරිපත් නොවූ බවත්, එකඟතාවය පළ කළ අයිතිකරුවන්ගේ ඉඩම්වල සිට ජලය නොමැති කොටස් සඳහා ජලය ලබා දීමට දුර ප්‍රමාණ අනුව නොහැකි වූ බවත්, ඉදිරි මාස 4 ක කාලය ඇතුළත මෙම ව්‍යාපෘති සඳහා වන යෝජනා අනුමත කරවාගෙන එම ව්‍යාපෘති සම්පූර්ණයෙන් සිදු කර අවසන් කිරීමට අවශ්‍ය වන නිසා එම වසමෙන් වෙනත් වසමක් වන ඇටවල දංවත්තට මෙම ජල ව්‍යාපෘතිය ගෙන යාමට සිදු වූ බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා</u>

ගලගම ප්‍රදේශයට වෙන් වූ ප්‍රතිපාදන වෙනත් ප්‍රදේශයකට ගෙන යාමට පෙර නැවත වරක් ජනතාව දැනුවත් කොට ස්ථානයක් සොයා ගැනීමට කෙටි කාලයක් ලබා දෙන ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, මීගාර වලල්ලාවිට මැතිතුමා</u>

ගලගම ප්‍රදේශයේ රැස්වීමක් පවත්වා ජනතාව දැනුවත් කළ බවත්, නමුත් කිසිවෙකු ඉඩමක් ලබා දීමට කැමැත්තක් නොදැක්වූ බැවින් ද මහජන විරෝධයක් ඇති වූ බැවින් ද එම ව්‍යාපෘතිය එම ඡන්ද කොට්ඨාසයේම ඇටවල ප්‍රදේශයට ගෙන යාමට සිදු වූ බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පසුගිය වසරේ නොවැම්බර් මාසයේ දී දකුණු පළාතේ ජල ව්‍යාපෘති සඳහා ඉතිරි ව තිබූ ප්‍රතිපාදන තිබෙන බව දැන එම මුදල් අප වෙත ලබා ගෙන දින 10 ක පමණ කාලයක් තුළ මහගොඩ ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් සිදු කළ බවත්, ගලගම ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් සකස් කිරීම සඳහා භූමි ප්‍රදේශයක් ලැබුණෝතින් මෙම වර්ෂයේ ද ඉතිරි වූ ප්‍රතිපාදන තිබුණෝතින් ඒ හරහා ගලගම ප්‍රදේශයේ ද ජල ව්‍යාපෘතියක් ඉදි කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.6. ඇටවලවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ 5 වන පටුමගේ මීටර් 60 ක් පමණ සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.7. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2026 යටතේ ඇටවල දංවත්ත ග්‍රාමයේ ඉදි කරන ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාළ නළ ළිඳ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් සකස් කර දීමට අදාළව ලබා දී ඇති රු. 553,934.36 ක් වන (බදු සහිත) මිල ගණන් පිළිගෙන එම කාර්යය එකී ආයතනය මඟින්

සිදු කිරීමටත්, ජල සම්පාදන මණ්ඩලය මඟින් අංක මා/භූජ/03/01/01 හා 2026.07.09 දිනැති ජාතික ජල සම්පාදන මණ්ඩලයේ, භූගත ජල අංශය, මාතරහි ජොෂ්ඨ ජලභූවිද්‍යාඥගේ ලිපියේ සඳහන් කොන්දේසිවලට එකඟව එකී මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව සභා අරමුදලින් ගෙවීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.8. ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා සිදු කිරීමට නියමිත පහත සඳහන් කර්මාන්තවලට අදාළ ඇස්තමේන්තු පිළිගෙන සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මාර්ගයේ/ කර්මාන්තයේ නම | ඇස්තමේන්තුගත මුදල (රු.) |
|---|---|---|
| 01 | කපුගස්දූව ගුණානන්ද මාවත කොන්ක්‍රීට් කිරීම | 1,185,563.01 |
| 02 | කැකිරිගත්හේන පාර කොන්ක්‍රීට් කිරීම | 906,084.19 |
| 03 | කුඩා ඌරගහ දිද්දුගොඩ මාර්ගයේ බටදූව පළවන හරස් මාර්ගය සද්ධාසේන මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීම | 1,140,272.93 |
| 04 | මහ ඌරගහ ප්‍රධාන පාරේ සිට මඩකුඹුර මාර්ගයේ මීටර් 200 ක් පමණ දුරින් බෝධිය ළඟින් ඇති පටුවගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,224,762.27 |
| 05 | හොරවල ප්‍රධාන මාර්ගයේ සිට කුමාර ගුණවර්ධන මහතාගේ නිවස දක්වා රෝහල ඉදිරිපිටින් දිවෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 768,713.64 |
| 06 | ගල්වලහේන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 941,711.13 |
| 07 | මිරිස්වත්ත හොරවල ප්‍රධාන මාර්ගයේ සිට ගුණවර්ධන මහතාගේ නිවස අසලින් ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 738,729.91 |
| 08 | තපෝදාරාම පන්සල පාර 03 වන අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 941,711.13 |
| 09 | වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ මුණසිංහ වත්ත ගයාන් හෝටලය ඉදිරිපිට මාර්ගය තාර දැමීම | 1,965,975.42 |
| 10 | රන්තොටුවිල හිවත්තගොඩ මාර්ගය තාර දැමීම | 528,033.82 |
| 11 | මොරගොඩ පන්සල මාර්ගය තාර දැමීම | 1,441,603.75 |
| 12 | ඇටවල සිට දන්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 580,408.73 |
| 13 | මිරිස්වත්ත කොබෙයිදූව මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ සංශෝධිත ඇස්තමේන්තුව | 1,320,522.20 |
| 14 | උඩුමුල්ල මානාන ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ නළ ළිඳක් ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුව ( ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ) | 553,934.36 |
| 15 | ඇටවල දංවත්ත ප්‍රදේශයේ නළ ළිඳ ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුව | 553,934.36 |
| 16 | බෙන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාර භූමියේ අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදි කිරීමේ අදියර I | 12,955,912.24 |
| 17 | ඇටවලවත්ත නැගෙනහිර 5 වන පටුමගේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම | 761,544.63 |

| | | |
|---|---|---|
| 18 | කන්දෙමුල්ල පොල්වත්ත ප්‍රධාන මාර්ගයේ චමින්ද මහතාගේ, චන්දිකමල් මහතාගේ හා සුනිල් සමරවීරහෙට්ටි යන මහත්වරුන්ගේ නිවෙස් ඉදිරිපිට මාර්ගය කාර දැමීම | 1,023,197.52 |
| 19 | හබක්කල හෙට්ටිගොඩ ප්‍රධාන මාර්ගය තාර දැමීම | 475,272.44 |
| 20 | මුල්ලගොඩ පාම්මඩුවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,404,679.29 |
| 21 | තේක්කවත්ත ඉඳුරුවෙල මාර්ගය තාර දැමීම | 917,078.33 |
| 22 | උඩුමුල්ල මානාන ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ජල ටැංකිය හා නළ පද්ධතිය ඉදි කිරීම | 1,416,136.00 |
| 23 | ඇටවල දංවත්ත ප්‍රදේශයේ ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ජල ටැංකිය හා නළ පද්ධතිය ඉදි කිරීම | 1,395,089.64 |

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පෙරමුසු යොදා සකස් කිරීමට ඇස්තමේන්තු ඉදිරිපත් කළ මාර්ග සංවර්ධනය ප්‍රමාද වීමට ඉඩ ඇති බවත්, මේ දිනවල ලංකාවේ පෙරමුසු අවසන් වී ඇති බවත්, නැවත යුද්ධය ආරම්භ වී ඇති බැවින් ලංකාවට නැවත තාර එන දිනයක් පිළිබඳ නිශ්චිතව සඳහන් කළ නොහැකි බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.7. <u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>

5.7.1. හබුරුගල කොට්ඨාසයේ සූරියගම ග්‍රාම නිලධාරී වසමට අයත් තුඩුව - ගෝනගලපුර මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමටත්, මාර්ගය දෙපස ඇති ගස්වල අතු කපා මාර්ගය පිරිසිදු කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
මෙම මාර්ගය බොහෝ සේ අබලන්ව පවතින බවත්, කඩිනමින් මෙම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.2. ප්‍රාදේශීය සභා සභිකයින් වෙත තම අධිකරණ බල ප්‍රදේශයට සාමවිනිසුරු තනතුරට හිමිකම් කීමේ හැකියාව ඇති බැවින් ඒ සඳහා අවශ්‍යතාව ඇති සභිකයින්ට එම අවස්ථාව ලබා ගැනීමට සුදුසු කාර්යයන් ඉටු කර දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.8. <u>ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.8.1. විශාල ජනතාවක් ගමන් කරන ඇටවලවත්ත උතුර පළවන පටුමග පාර ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා</u>**
මෙම මාර්ගය මීටර් 50 ක පමණ කොටසක් වන බවත්, ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් කඩිනමින් කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.9. <u>ගරු මන්ත්‍රී, සමිත පුංචිහේවා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.9.1. වරකාමුල්ල කොට්ඨාසයේ ඉඳුරුව මහා විද්‍යාලයට වතුරුවෙල - බාන්වැල්දූව දෙසින් පිවිසුම් මාර්ගය වන පහළ ලූල්වල මාර්ගය විශාල වශයෙන් වල් බිහිවී අඩි පාරක් බවට පත් වී ඇත. මෙම මාර්ගය සභාවේ බැකෝ යන්ත්‍රය යොදවා පිළිසකර කර දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, සමිත පුංචිහේවා මැතිතුමා</u>**
මෙම මාර්ගය දෙපස කැළය වැවී මාර්ගය පටු වී ඇති බවත්, පාසල් ළමුන් බහුලව භාවිත කරන මාර්ගයක් වන බැවින් එය දෙපස සුද්ධ කොට මාර්ගය සකස් කර දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>**
කුලතුංග මාමාගේ නිවස වනතෙක් පාර පළල්ව පවතින නමුත් ඉන් ඉදිරියට පවතින්නේ අඩි පාරක් බවත්, පාර දෙපස වල් බිහි වී ඇති බවත්, මෙම මාර්ගය බහුලවම පාසල් හා ටියුෂන් පන්ති යන දරුවන් විසින් භාවිත කරනු ලබන බවත්, මේ වන විට අනතුරු 02 ක් සිදු වී තිබෙන මාර්ගයක් බැවින් එය සකස් කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.10.** **<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.10.1. සව්සිරි උයන පිවිසුම් මාර්ගයේ පිවිසුමේ සිට මීටර් 50 ක් පමණ දුරින් ජලය බැස යාමට බෝක්කුවක් යෙදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
මෙම මාර්ගයේ ඉහත සඳහන් කළ කොටසේ ජලය බැස යාමට ස්ථානයක් නොමැතිව පාර පුරා ජලය රැඳී තිබෙන බවත්, එම මාර්ගය පාසල් සිසුන් පයින් ගමන් කිරීමට භාවිත කරන බවත්, එම නිසා ජලය බැස යාමට බෝක්කුවක් සකස් කර දීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.2. මහවිල හේනගෙදර වත්ත පාර භාවිතයට සුදුසු අන්දමින් පිළිසකර කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
මෙම මාර්ගය කොරිපස් කියුබ් කීපයක් යොදා හෝ ගමන් කළ හැකි මට්ටමට සකසා දීම සුදුසු වන බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.3. හොරවල දෙවොල් දේවාල භූමිය සඳහා කසල බඳුනක් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
ප්ලාස්ටික් බෝතල් වැනි දෑ දැමීමට සුදුසු කසල බඳුනක් මේ සඳහා යෙදීම සුදුසු බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 10.40 ට ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදි.

**5.11. <u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.11.1. උඩුමුල්ල, මහ ඉඳුරුව ග්‍රාමයෙහි ප්‍රජා ශාලාව නැවත ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>**
10 සී කන්දෙමුල්ල ග්‍රාම සේවක කොට්ඨාසයේ මෙම ප්‍රජා ශාලාව පිහිටා ඇති බවත්, මේ වන විට එහි කිසිඳු කාර්යාලයක් නොපවත්වන බවත්, කුඩා දරුවන්ගේ බර කිරීමට මෙන්ම ටියුෂන් පන්ති පැවැත්වීම සඳහා යොදා ගනු ලබන බවත්, මීට පෙර පැවති සභා කලයක දී මෙම ප්‍රජා ශාලාව සභාවට පවරාගෙන ඇති බවට ග්‍රාම නිලධාරිතුමිය ප්‍රකාශ කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.12. <u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.12.1. ඉඳුරුව යාලේගම බෝධිනාගොඩ හරහා මාර්ගය බැකෝ යන්ත්‍රය යොදා පළල් කර දෙන මෙන් යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
එම ස්ථානයට බැකෝ යන්ත්‍රය ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් තිබෙන බවත්, ගස් පේළිය ඉවත් කිරීමට පළමුව කටයුතු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.13. <u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.13.1. පිටාරඹ ධර්මවිජයාරාම පන්සල ඉදිරිපිට ඇති කාණුව බලි ඇළ දක්වා සුද්ධ පවිත්‍ර කර දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.13.2. යාත්‍රාමුල්ල මංසන්ධියේ සිට යාත්‍රාමුල්ල ධර්මාරාම පාසල ඉදිරිපිටින් යන කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 10.45 ට ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදි.

**5.14. <u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.14.1. ඇලකාක ග්‍රාම නිලධාරී වසමේ ඇලකාක මරුමුල්ල මාර්ගය ගමනාගමනයට සුදුසු පරිදි පස් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.15. <u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා:-</u>**

5.15.1. මහ ඉඳුරුව නෙළුම්පොකුණගම පිවිසුම් මාර්ගයේ කාණු පද්ධතිය නිසි ලෙස නිමවා මාර්ගයේ කැඩී ඇති ස්ථාන පිළිසකර කර දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**

මෙම මාර්ගය කොන්ක්‍රීට් කරන ලද මාර්ගයක් වන බවත්, එහි අබලන් වී ඇති ස්ථාන පිළිසකර කර දෙන ලෙසත්, ජලය බැස යාම සඳහා කාණු පද්ධතිය පිළිසකර කර දෙන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.16. ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-**

5.16.1. කෝම්මල ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ආබාධිත වයෝවෘද්ධ සාමාජිකයින්ගෙන් යුත් එස්. එල්. සෝමවතී මහත්මියගේ පවුල අඩු ආදායම්ලාභී පවුලකි. ඇයගේ ඉල්ලීම ප්‍රකාරව ජල සම්බන්ධතා හෝ වෙනත් පානීය ජල මූලාශ්‍රයක් නොමැතිව පීඩා විඳි එම නිවැසියන්ට සභාවේ අරමුදලින් ජල සබඳතා ලබා දීම සුදුසු බවට 2026.02.03 දිනැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශය සඳහා 2026.03.10 මහ සභාවේ දී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මාසික බිල්පත් ගාස්තු හා වෙනත් සියලු නඩත්තු වියදම් එම නිවැසියන් විසින් දැරීමට යටත්ව ප්‍රාදේශීය සභා අරමුදලින් මුදල් ගෙවා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් නව ජල සම්බන්ධතාවක් ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2026.05.14 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

2026.05.14 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2026.05.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

2026.05.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.3. 2026.05.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

2026.05.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

6.4. 2026.06.05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

2026.06.05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

6.5. 2026.06.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

2026.06.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

6.6. 2026.06.17 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

2026.06.17 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**<u>7.1. 2026 ජූනි මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026 ජූනි මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2026 ජූනි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 9,470,904.64 |
| එකතු කළා මූලධන ලැබීම් :- | රු. 2,800.00 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 9,473,704.64** |
| සේවක ණය | රු. 822,289.81 |
| තැන්පත් | රු. 430,853.67 |
| දේපළ ණය පොළී | රු. 10,746.23 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 110,468.00 |
| බලපත්‍ර බදු | රු. 11,150.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,525.00 |

| | |
|---|---|
| 101 ට බැර | රු. 77,091.70 |
| 201 ට බැර | රු. 63,986.36 |
| 301 ට බැර | රු. 54,399.04 |
| ස්ථාවර තැන්පත් | රු. 7,500,000.00 |
| එකතුව | **රු. 18,558,214.45** |
| 2026 ජුනි මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 14,507,881.57 |
| එකතු කළා -ප්‍රාග්ධන වියදම් | රු. 3,278,301.57 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 17,786,183.14** |
| දේපළ ණය පොලී | රු. 10,860.54 |
| තැන්පත් | රු. 1,691,685.40 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 115,918.00 |
| සේවක ණය | රු. 1,234,375.00 |
| ගබඩා අත්තිකාරම් | රු. 96,450.00 |
| එකතුව | **රු. 20,935,472.08** |

**<u>7.2. 2026.06.30 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.06.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරන පොදු ජංගම ගිණුම හා අංක 81618288 දරන සේවක ණය ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**<u>7.3. 2026.06.30 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.06.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| ආදායම් ශීර්ෂය | | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|---|
| 1. | වරිපනම් බදු | රු. 9,239,332.87 |
| 2. | අක්කර බදු | රු. 191,448.00 |
| 3. | 1 % බදු | - |
| 4. | කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 8,300.00 |
| 8. | වෙළඳ ස්ථාන කුළී | - |
| 10. | වෙළඳ බලපත්‍ර ගාස්තු | රු. 4,000.00 |
| 12. | ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු | රු. 2,950.00 |
| | **එකතුව** | **රු. 9,446,030.87** |

**7.4. ගෙවීම් වවුචර් අනුමත කිරීම.**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | | ගල්බඩ කටුකොළිහ වීර පැරකුම් ග්‍රාම සංවර්ධන සමිතියේ බෙන්තොට ග්‍රාමීය බැංකු ගි.අ. 1025395-7 | ගල්බඩ ගම්මැද්ද මාර්ගය කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ රඳවුම් මුදල් නිදහස් කිරීම | 62,244.42 |
| 02 | | මිරිස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියේ ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගි.අ. 215011500121 | මිරිස්වත්ත නිල සෙවන ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ රඳවුම් මුදල් නිදහස් කිරීම | 59,593.07 |
| 03 | | මිරිස්වත්ත සමගි වැඩිහිටි සමිතියේ මිරිස්වත්ත ග්‍රාමීය බැංකු ගි.අ. 6621 | කොබෙයිදූව පෙර පාසලේ රඳවුම් බිත්තිය සමඟ ආරක්ෂිත වැට ඉදි කිරීමේ ව්‍යාපෘතියේ රඳවුම් මුදල් නිදහස් කිරීම | 200,000.00 |
| 04 | | P.N. Construction | බෙන්තොට හොරවල තොටුපළ හන්දියේ සිට තොටුපළ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ රඳවුම් මුදල් ගෙවීම | 619,436.97 |

ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**8.** වෙනත් කරුණු

**8.1.** ටෙන්ඩර් හා මිල ගණන් **:-** නැත

**8.2.** ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම **:-**

ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා

මීට සති කීපයකට පෙර හබුරුගල ග්‍රාම නිලධාරී වසමේ උලුකැපුවත්ත ප්‍රදේශයේ කොහොඹ ගස් කීපයක් සභාව විසින් කපා වෙන්දේසි කොට ඇති බවත්, එම වෙන්දේසි කිරීම සභාවේ පරිසර නිලධාරිතුමිය ද නොදැනුවත්ව සිදු කර ඇති බවත්, එසේම ඒවා ටෙන්ඩර් කිරීම සඳහා සභාවේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් සහභාගී වී ඇති බවත්, පර්මිට් ගැටලුවක් හේතුවෙන් තවමත් එම ගස් රැගෙන ගොස් නොමැතිව එම ස්ථානයේම පවතින බවත්, මෙවැනි සිදුවීම් තුළින් සභාව සහ මන්ත්‍රීවරුන් අපකීර්තියට පත්වන බවත්,

පෙර සිටි පරිසර නිලධාරීතුමියට හෝ වර්තමාන පරිසර නිලධාරීතුමාට මේ පිළිබඳ දැනුම් දීමක් සිදු කර නොතිබූ බවත්, එම ගස් පිහිටා ඇති ප්‍රදේශය අවට ප්‍රධාන ලී මෝල් 02 ක් පවතින නමුත් කිසිඳු ලී මෝලක් මේ පිළිබඳව දැනුවත් වී නොතිබූ බවත්, මෙම වෙන්දේසිය පිළිබඳ හබුරුගල ග්‍රාමීය බැංකුවේ හා උප තැපැල් කාර්යාලයේ පමණක් දැන්වීම් අලවා තිබූ බවත්, එම ආයතන 02 ම සූරියගම වසමට අයත් වන අතර හබුරුගල වසම තුළ කිසිම ස්ථානයක දැන්වීම් ප්‍රදර්ශනය කර නොතිබූ බවත්, අපගේ උප කාර්යාලයේ පවා දැන්වීමක් ප්‍රදර්ශනය කර නොතිබූ බවත්, රු. 150,000/- ක් පමණ වන කොහොඹ ගස් 03 ක් රු. 20,500/- ක් වැනි ඉතාමත් අඩු මුදලකට වෙන්දේසි කර ඇති බවත්, මේ ගස් පිළිබඳ පැමිණිලි පාර්ශ්වය පවා මෙම වෙන්දේසිය පිළිබඳ දැනුවත් වී නොමැති බවත්, ගම් වැසියන් තුළ මේ සම්බන්ධයෙන් අප විසින් අත යටින් මුදල් ලබා ගෙන සිදු කර ඇති බවට මතයක් ගොඩනැගී ඇති බවත්, මෙවැනි දෑ ඉදිරියට සිදු නොවීමට වග බලා ගන්නා ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

හබුරුගල උප කාර්යාලය මඟින් එම වෙන්දේසිය සිදු කළ බවත්, උප තැපැල් කාර්යාලය ඇතුළු ස්ථානවල දැන්වීම් අලවා තිබූ අතර සෑම ස්ථානයකම අඩියෙන් අඩිය දැන්වීම් ඇලවීමේ අවශ්‍යතාවයක් නොවන බවත්, එම වෙන්දේසි කටයුතු සඳහා එක් නිලධාරියෙක් පමණක් සහභාගීවීම වුවත් ප්‍රමාණවත් වන බවත්, ලී මෝල් හිමියන් දැනුවත් කිරීමට සභාව බැඳී නොමැති බවත්, දැන්වීමක් දුටු විට ඒ සම්බන්ධයෙන් සොයා බැලීම ඔවුන්ගේ කටයුත්තක් වන බවත්, වෙන්දේසිය සඳහා දෙදෙනෙකු පැමිණ ඇති අතර ඉන් එක් අයෙකුට එම ගස් ලැබී ඇති බවත්, ගැටලුව මතු වී තිබෙන්නේ වෙන්දේසියෙන් පසු වෙනත් අයෙකු පැමිණ එම ගස් ඉල්ලා තිබූ අවස්ථාවේ වෙන්දේසිය අවසන් බව දැනුවත් කිරීම වන බවත්, අප ආයතනය මඟින් පරිසර බලපත්‍ර ලබා ගන්නා ලී මෝල් වෙත වෙන්දේසිය සම්බන්ධයෙන් දැනුවත් කොට ලිපි යවා ඇති බවත්, ඉදිරියේ දී සිදු කරනු ලබන වෙන්දේසි පිළිබඳ ප්‍රදේශයේ සියලුම රාජ්‍ය ආයතනවල දැන්වීම් සවි කිරීම හා අපගේ මන්ත්‍රීවරුන්ගේ වට්ස්ඇප් සමූහය වෙතට ඒ පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කිරීමට කටයුතු කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, පූණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා</u>

13 බී මාලවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ප්‍රජා ශාලාව සහිත භූමිය දැඩි ලෙස අබලන් තත්ත්වයේ පවතින බැවින් අලුතින් සෑදීමට යෝජනා වී ඇති බවත්, එය අප සභාව සතුව පවතින්නක්ද නැතිනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින්නක්දැයි පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

එය සභාව සතුව පවතින්නක් බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා</u>

පසුගිය සභා වාරය සඳහා මා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමක් සිදු කිරීම සඳහා මෙම අවස්ථාව යොදා ගන්නා බවත්, එහි ප්‍රමුඛතාවය යන්න ඉතාමත් වැදගත් වන බවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සියලුම පාරවල් ප්‍රමුඛතාවය මත සංවර්ධනය කළ යුතු බවත්, ඒ සම්බන්ධයෙන් යෝජනාව සමඟ මා විසින් දක්වා තිබූ කරුණු පැහැදිලි කිරීම මේ අවස්ථාවේ සභාව වෙත ඉදිරිපත් කරන බවත් සඳහන් කරන ලදී.

1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් හා වරියන් විසින් 2025 වර්ෂයේ සහ 2026 වර්ෂයේ අප්‍රේල් මස දක්වා ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති මෙන්ම මෙතෙක් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොකරන ලද බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති සියලුම පාරවල් අබලන්වීමේ ප්‍රවණතාවයේ වැඩි තත්ත්වයේ සිට අඩු තත්ත්වය දක්වා ප්‍රමුඛතා ලේඛන සකස් විය යුතුය.

2. ප්‍රථමයෙන්ම ග්‍රාම සේවා වසම් මට්ටමෙන් මෙම ප්‍රමුඛතා ලේඛන සකස් විය යුතු අතර එක් පියවරක් ලෙස අදාළ ග්‍රාම සේවා වසම තුළ පදිංචිව සිටින ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට හෝ මන්ත්‍රීවරියට මෙම ප්‍රමුඛතාවය තීන්දු කිරීමේ වගකීම භාරදිය යුතුය.

3. එක් ග්‍රාම සේවා වසමක් තුළ මන්ත්‍රීවරුන් කීප පොළක්ම පදිංචිව සිටී නම් එම කොට්ඨාසය තුළ ප්‍රමුඛතාවය තීන්දු කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ දායකත්වය ලබා ගැනීම සිදුකළ යුතු වේ.

4. අදාළ ග්‍රාම සේවා වසම තුළ පදිංචි වී සිටින සභිකයින් අතරේ එකිනෙකට වෙනස් දේශපාලන පක්ෂ හා ස්වාධීන මන්ත්‍රීවරුන් සිටී නම් ඔවුන්ගේ සාකච්ඡාමය සුහදතාවය මෙම ප්‍රමුඛතාවය සඳහා ඉවහල් කරගත යුතුය. (මෙහිදී 23 දෙනාම එකතු වී යන සංකල්පය අරමුණු කරගන්නේ නම් එය වැදගත්ය.)
5. ඉහත 4 ආකාරයට ග්‍රාම සේවා වසම තුළ ප්‍රමුඛතාවය සුහදව තීන්දු කර ගැනීමට නොහැකි නම් සභාපතිතුමා ඉදිරියේ කාසියේ වාසිය උරගා බැලීමෙන් හෝ තුන්ඩු උඩ දැමීම වැනි ක්‍රියාවකින් එය විසඳාගත යුතුය.

6. ග්‍රාම සේවා වසම් තුළ මාර්ග ප්‍රමුඛතා ලේඛන සකස් කළ පසු වසම් තුළ අංක එකට අබලන් වූ පාරවල් ගෙන ඡන්ද කොට්ඨාසය තුළ තවත් ප්‍රමුඛතා ලේඛනයක් සකස් කළ යුතුය. එම කටයුතු සඳහා අවශ්‍ය වන්නේ නම් ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරීන්ද සහභාගී කරගත හැකිය.

7. ඉහත ක්‍රියාවලියට පසු ඡන්ද කොට්ඨාස මට්ටමින් බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රමුඛව අබලන් වූ පාරවල් සොයා ගත හැකි අතර ඡන්ද කොට්ඨාස 13 සඳහා වූ ප්‍රමුඛතා මාර්ග 13ක් සොයාගත හැකිය.

8. එම මාර්ග 13 හඳුනාගත් පසු ප්‍රතිසංස්කරණය කිරීමේ අනුපිළිවෙල සකස් කර ගැනීම සඳහා විශේෂිත වූ ක්‍රමයක් යෝජනා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට අවකාශ ලබාදිය යුතුය.

9. 2025 වර්ෂයේ සහ 2026 වර්ෂයේ මේ දක්වා ප්‍රතිසංස්කරණය අවසන් වූ මෙන්ම ප්‍රතිසංස්කරණය වෙමින් පවතින මාර්ග මෙම ප්‍රමුඛතාවයට අදාළ කර නොගත යුතුය.

ඉහත ආකාරයට ප්‍රමුඛතා ලේඛන සකස් කොට ඒ අනුව ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා කිරීමට හේතු.

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් යනු යම්කිසි බල ප්‍රදේශයක් සඳහා මහජන නියෝජිතයන් පිරිසක් වන අතර මාර්ග ප්‍රතිසංස්කරණය සම්බන්ධව අප නියෝජනය කරනු ලබන ඡන්ද කොට්ඨාසවල ජනතාව නිරන්තරයෙන් අපගෙන් ප්‍රශ්න කරනු ලබති. එමෙන්ම ජනතාව විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අභ්‍යන්තරයේ විවිධ අවශ්‍යතා සඳහා ගමන් කරන විට මාර්ග ප්‍රතිසංස්කරණ පිළිබඳ විවිධ සිදුවීම් දකින අතර සමහර කොට්ඨාසවල මාර්ග ප්‍රතිසංස්කරණය කර තිබීමත් තමන්ගේ වසම තුළ එසේ නොතිබීමත් තමන්ට

සිදුවන අසාධාරණයක් ලෙස දකිති. ඒ පිළිබඳව අපෙන් විමසන විට ප්‍රාදේශීය සභාව මඟින් නිසි ක්‍රමයක් අනුගමනය කරන බවට ඔවුන් දැනුවත් කිරීම සඳහා ක්‍රමයක් සකස් වී තිබිය යුතුය. එසේ නොවන කල්හි අප දැඩි අපහසුතාවයකට පත්වේ. එම නිසා නිසි ක්‍රමවේදයක් සකස් කර ගැනීමේ අරමුණින් මෙම යෝජනා ඉදිරිපත් කරන ලද බව කාරුණිකව සඳහන් කරමි.
2026.02.10 දින මාසික මහ සභා වාර්තාවේ අංක 04 පිටුවේ 4.1.5 යටතේ මා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලෙස "අබලන් වූ මාර්ග ප්‍රමුඛතාවය අනුව ප්‍රතිසංස්කරණය කරයි" යනුවෙන් ඔබතුමා විසින් සඳහන් කර ඇති බව ද කාරුණිකව සඳහන් කරමි.

මෙහි මුල් පියවර ලෙස පළමුව ග්‍රාම නිලධාරී වසම තුළට යා යුතු බවත්, එක් ඡන්ද කොට්ඨාසයක් තුළ ඇති ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව තුළ ප්‍රමුඛතා පාරවල් තෝරා ගැනීමේ දී එම ඡන්ද කොට්ඨාසය තුළ පදිංචි සියලුම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සංඛ්‍යාවට අනුව ප්‍රමුඛතා සංඛ්‍යාව තීරණය කළ යුතු බවත්, උදාහරණයක් ලෙස අතුරුවැල්ල ඡන්ද කොට්ඨාසයේ මන්ත්‍රීවරුන් තිදෙනෙකු සිටින බවත්, මිගාර මන්ත්‍රීතුමා, නිහාල් මන්ත්‍රීතුමා සහ මම ඒ තිදෙනා වන බවත්, අතුරුවැල්ල ඡන්ද කොට්ඨාසයේ ග්‍රාම සේවා වසම් 5 ක් පවතින බවත්, යාලගම, ගලගම, ගල්බඩ, අතුරුවැල්ල හා ඔලගන්දුව යන වසම් 5 හිම තුන්වන ස්ථානය මා හට ලබා දෙන ලෙස නිහතමානීව ප්‍රකාශ කරන බවත්, ඉතිරි අංක 02 අනෙක් මන්ත්‍රීවරුන් දෙදෙනාට ලබා දෙන බවත්, ඒ අනුව ජනතාවට ප්‍රකාශ කළ හැකි ස්ථිර ක්‍රමවේදයක් සභාව තුළ සකස් කළ හැකි බවත්, ග්‍රාම සේවා වසම් මට්ටමින් ඡන්ද කොට්ඨාස 13 හි මන්ත්‍රීවරුන්ගේ නම් හා දුරකතන අංක ලබා දෙන ලෙසත් එවිට ලබන සභා වාරය වන විට වසම් මට්ටමින් ඔවුන් සමග සාකච්ඡා කොට ප්‍රමුඛතා ලේඛනයක් සකස් කිරීමට තමන් පුද්ගලිකව මැදිහත් වීමට කැමති බවත්, මේ සඳහා සියලුම මන්ත්‍රීවරුන්ගේ අවධානය ලබා දෙන ලෙස ඉල්ලන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම ක්‍රමවේදය පිළිබඳ ගැටලුවක් නොමැති බවත්, ගමේ මන්ත්‍රීවරයා විසින් යෝජනා සභාව වෙත ගෙන එන බවත්, ගමේ සාමාජිකයන් රැස් කර යෝජනා ලබා නොගන්නා බවත්, එවැනි ක්‍රමවේදයක් මෙතෙක් නොමැති බවත්, නමුත් සභාව තුළින් පමණක් ප්‍රජාතන්ත්‍රවාදය සෙවීම නුසුදුසු බවත්, මාගේ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 03 ටම සිටින එකම මහජන නියෝජිතයා මම වන නමුත් කොට්ඨාසයේ සිදුවන කිසිඳු දෙයක් පිළිබඳ මා දැනුවත් නොකරන බවත්, මාගේ පරම්පරාවෙන් එන ඉඩමක මාගේ නිවස අසල ප්‍රජා ශාලාව ඉදි කර තිබුණ ද එහි තිබෙන කිසිඳු රැස්වීමක් පිළිබඳ මා දැනුවත් නොකරන බවත්, පළමුව මන්ත්‍රීතුමාලාගේ පැත්තෙන් ද ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සැලැකිලිමත් වන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

හබුරුගල උප කාර්යාලයේ ඖෂධ සංයෝජක සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වී තිබෙන බවට දැනගන්නට ලැබුණු බවත්, තමන් සිටින ස්ථානය සුද්ධ පවිත්‍ර කරගෙන සිටීම ගැටලුවක් නොවන නමුත් කම්කරු පත්වීමක් තිබෙන කෙනා කාගේ හෝ උපදේශයකට අනුව එම කටයුතු නොකර සිට එය වෙනත් අයෙකුට කරන ලෙස බල කිරීම නොකළ යුත්තක් වන බවත්, ඒ සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද, ඒවා දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග ද නැතිනම් තාවකාලික විසඳුම් දැයි පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ආයුර්වේදය තුළ සිටින්නේ වෛද්‍යතුමිය හා ඖෂධ සංයෝජක පමණක් වන අතර එහි ඇතුළත වෙනම වැසිකිළියක් පවතින බවත්, රෝගීන් සඳහා පිටත වැසිකිළියක් තිබෙන බවත්, පෙර සිටි වෛද්‍යතුමියගේ

කාලයේ මෙය පිරිසිදු කර ගැනීම ගැටලුවක් ලෙස ඉස්මතු නොවූ බවත්, නමුත් නව වෛද්‍යාතුමිය හා ඖෂධ සංයෝජක අතර යම් වචන හුවමාරුවක් සිදු වී තිබෙන බවත්, අවසානයේ එම ගැටුම රෝගීන් ඉදිරියේ ද සිදු වන තත්ත්වයට පත්ව ඇති බවත්, හබුරුගල ආයුර්වේදය සඳහා පැමිණෙන පිරිසේ ධාරිතාවය වැඩි බැවින් වෛද්‍යාතුමිය වෙනස් කළ නොහැකි නිසා මේ වන විට එම ඖෂධ සංයෝජක මහත්මිය බෙන්තර ආයුර්වේදයටත් බෙන්තර සිටින ඖෂධ සංයෝජක මහත්මිය හබුරුගල ආයුර්වේදයටත් අනුයුක්ත කිරීමට තීරණය කර ඇති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය පැහැදිලි වූ බවත්, මෙම ගැටලුව ඇති වූ හබුරුගල උප කාර්යාලයේ එම කටයුතු සඳහා කම්කරුවන් නොමැති ද යන්න පිළිබඳවත් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

එක් කම්කරුවෙකු උප කාර්යාලයේ සිටින බවත්, උප කාර්යාලයේ සියලුම වැසිකිළි 7 ක් තිබෙන බවත්, ආයුර්වේදය තුළ පවතින වැසිකිළිය පිටස්තර පුද්ගලයින් හෝ උප කාර්යාලයේ වෙනත් කිසිවෙකු භාවිතයට නොගන්නා බවත්, එය මෙතෙක් කල් ඔවුන් විසින්ම පිරිසිදු කොට තබා ගත් බවත්, නව වෛද්‍යාතුමිය සහ ඖෂධ සංයෝජක මහත්මිය අතර පවතින වෙනත් පුද්ගලික විරසකයක් හේතුවෙන් මෙය ගැටලුවක් දක්වා දුර දිග ගොස් ඇති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

ඖෂධ සංයෝජක මහත්මිය බෙන්තරට මාරු කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් නොමැති බවත්, බෙන්තර කොට්ඨාසය තුළ ඕනෑම ස්ථානයක වැඩ කටයුතු කිරීමට ඔවුන් බැඳී සිටින බවත්, වෛද්‍යාතුමිය රෝගීන් සමඟ කටයුතු කරන නිසාත්, ඖෂධ සංයෝජක මහත්මිය බෙහෙත් වර්ග අල්ලන නිසාත් ඔවුන් දෙදෙනාගේ ප්‍රකාශ සාධාරණ වන බවත්, නමුත් එම කටයුතු සඳහා කම්කරුවෙක් සිටිය දී ඔහු ඒ කටයුතු නොකර සිටීම සාධාරණ නොවන බවත්, මෙය මෙම අවස්ථාවේ දී කුඩා ගැටලුවක් ලෙස පෙනුණත් අනාගතයේ දී විශාල ගැටලුවක් බවට පත් වීමට ඉඩ ඇති බවත්, බහුතරයක් සේවකයින් අදාළ තනතුරේ රාජකාරී නොකර වෙනත් තනතුරුවල රාජකාරී කටයුතු කරමින් සිටින බව මීට පෙරත් සාකච්ඡා කළ බවත්, මේ සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

නිලධාරී පාලන සමයේ දී සේවා අවශ්‍යතාවය මත සේවකයන් හට වෙනත් තනතුරුවල රාජකාරි පවරා තිබුණත් නව ලේකම්තුමා පැමිණි පසු ඒ අය නැවත අදාළ තනතුරේ රාජකාරි සඳහා යෙදවීමට කටයුතු කරමින් පවතින බවත්, ඒ අයට ලිඛිතවම තම තනතුර හා ඊට අදාළ රාජකාරි සම්බන්ධයෙන් දැනුම් දීමක් ද සිදු කර ඇති බවත්, මේ නිසා ඉදිරියේ දී මෙවැනි ගැටලු ඇති නොවන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

අද දින මා විසින් සභාවට යෝජනාවක් ඉදිරිපත් කර නැති නමුත් සභා වාරය සඳහා පැමිණි බවත්, මුළු බෙන්තර කොට්ඨාසයම සම්බන්ධයෙන් මාගේ යම් දැනුවත්භාවයක් තිබෙන බවත්, අවශ්‍යතාවයක දී යම් අදහස් දැක්වීමක් සිදු කිරීමට පමණක් මා බලාපොරොත්තු වන බවත්, අද දින යෝජනාවක් ඉදිරිපත් නොකළ නිසා සභා රැස්වීම් සඳහා සහභාගී නොවී සිටීම ප්‍රායෝගික නොවන බවත්, අපගේ සම්බන්ධීකරණ

කමිටුවට යෝජනාවක් ඉදිරිපත් කර නොමැති නම් එදිනට සහභාගී වීමට නොහැකි බව මේ වන විට ස්ථිර වී ඇති බවත්, දැනට මාස ගණනාවක සිට මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූ බවත්, මන්ත්‍රීතුමා මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සාධාරණත්වයක් බලාපොරොත්තු වන නමුත් මෙතෙක් ඔබ 10 දෙනාට මන්ත්‍රී මණ්ඩලයේ 23 දෙනා වෙනුවෙන් සාධාරණයක් ඉටු කිරීමට නොහැකි වී තිබෙන බවත්, අදත් සම්බන්ධීකරණයෙන් සහභාගී වන පිරිසේ නම් ලැයිස්තුවක් එවා තිබූ බවත්, ඊට සහභාගී වීමේ අරමුණින් කුමන හෝ යෝජනාවක් ඉදිරිපත් කර මන්ත්‍රීවරුන් ඊට සහභාගී වන තත්ත්වයට පත්ව ඇති බවත්, ඉදිරියේ දී සම්බන්ධීකරණ කමිටුව කාලය නාස්ති කිරීමට යොදා ගන්නා රැස්වීමක් බවට පත් වීමට ඉඩ ඇති බවත්, කණ්ඩායම් නායක කොඩිතුවක්කු මන්ත්‍රීතුමාට මේ සම්බන්ධයෙන් නිශාන්ත පෙරේරා මැතිතුමා හා සාකච්ඡා කොට සම්බන්ධීකරණය සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දීමට කටයුතු කරන ලෙසත්, සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස නිශාන්ත පෙරේරා මැතිතුමාට වසම් 102 ක් පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් නොමැති බවත්, සමහර යෝජනාවලට අදාළ කරුණු දැක්වීම්වල දී ඒ අදාළ කොට්ඨාසයේ රාජ්‍ය නිලධාරී පවා දැනුවත් නොමැති කරුණු සම්බන්ධයෙන් මහජන නියෝජිතයින් ලෙස අදහස් දැක්වීම් පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් තුළ දී සිදු කර ඇති බවත්, එක් පාර්ශ්වයක් වෙනත් ගමනක් තනිව යන විට දී අපට ද අකමැත්තෙන් වුව ද තනිව ගමනක් යාමට උත්සාහ කිරීමට සිදුවන බවත්, සම්බන්ධීකරණයෙන් ගන්නා සෑම තීන්දු තීරණයකටම බෙන්තර සභාව ලෙස සහයෝගය ලබා දුන් බවත්, මේ වන විට රටේ ඩෙංගු රෝගය උත්සන්න වී ව්‍යසනයක් බවට පත් වී ඇති නමුත් පක්ෂ පාට භේද නොසලකා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා හෝ සම්බන්ධීකරණ කමිටුව හරහා සියල්ලන්ම එකට රැස් කර සාකච්ඡා කිරීමට වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බවත්, සභාවක් ලෙස අප විසින් කරගෙන යනු ලබන වැඩපිළිවෙළ තවදුරටත් සක්‍රීය කරමින් සිදු කරගෙන යන බවත්, සභාව පත්වී වසරකට අධික කාලයක් ගත ව ඇති නමුත් මෙවැනි කටයුතු හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී සහෝදර මන්ත්‍රීවරුන්ගේ සිත් රිදෙන අවස්ථා ද ඇති වන බවත්, ඒ පිළිබඳ සමාව භජනය කරන බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.30 ට ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදි.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

මෙවර සාහිත්‍ය උත්සවය සඳහා රු. 650,000/-ක ඇස්තමේන්තු මුදලක් අද දින සම්මත වූ අතර, පසුගිය වර්ෂයේ සාහිත්‍ය උත්සවය පිළිබඳ යම් මතක් කිරීමක් සිදු කළ යුතු වන බවත්, එය පැවැත්වූයේ බෙන්තොට ගාමිණී ජාතික පාසල් ප්‍රධාන ශාලාවේ බවත්, නමුත් එදින විදුලිය විසන්ධි වූ අවස්ථාවේ විදුහල්පතිතුමා විසින් ගේට්ටුව වසා තිබීම හේතුවෙන් ජෙනරේටරය රථයෙන් ඇතුළට රැගෙන යාමට නොහැකි වූ බවත්, ඒ හේතුවෙන් සභාවේ සේවකයන්ට එය ඔසවාගෙන ශාලාවට රැගෙන යන්නට සිදු වූ බවත්, එදින සභාපතිතුමා අසනීපෙන් පසු වූ නිසා මා උත්සවයේ කටයුතු වෙනුවෙන් ලොකු මැදිහත් වීමක් සිදු කළ බවත්, විදුහල්පතිතුමාගේ හැසිරීම හා ක්‍රියාකලාපය මත එදින උත්සවය දැඩි අපහසුතා මධ්‍යයේ සිදු කළ බවත්, මෙවර ද සාහිත්‍ය උත්සවය පවත්වන්නේ එම ස්ථානයේ ද නැතිනම් වෙනත් ස්ථානයක ද, එහිම පවත්වනවා නම් විදුහල්පතිතුමා සමඟ සාකච්ඡා කොට අපහසුතාවකින් තොරව එය සිදු කිරීමට කටයුතු කරන ලෙසත්, ඒ වගේම ඉදිරියේ දී එල්නිනෝ තත්ත්වයක් ඇති වීමට ඉඩ ඇති බව කාලගුණයෙන් දන්වා ඇති බවත්, ඒ සම්බන්ධව සභාව විසින් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරන ලෙසත්, සභාව සතු පොදු ළිං දැනට කොපමණක් සුද්ධ පවිත්‍ර කොට තිබෙනවා ද, ඉදිරියේ දී තව කොපමණ ප්‍රමාණයක් සුද්ධ පවිත්‍ර කරනවාද, ඒ හරහා මහ ජනතාවට සේවයක් ලබා දෙන්නේ කෙසේ ද, පසුගිය කාලයේ නළ ළිං ඉදි කිරීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කළ බවත්, තවමත් ඉන් එකක්වත් ක්‍රියාත්මක නොවුණු බවත්,

ඒවා ක්‍රියාත්මක වන්නේ කුමන කාලසීමාවක දී ද, එල්නිනෝ තත්ත්වයට පෙර එම කටයුතු අවසන් කර ගැනීමට කටයුතු සිදු කරන ලෙසත්, ග්‍රාම නිලධාරී වසමකට එක් නළ ළිඳක් හෝ පවතින ලෙස සකස් කර ගැනීමට හැකියාවක් පවතින්නේ නම් එය ඉතාම ප්‍රයෝජනවත් වන බවත්, පසුගිය කාලයේ පැවති සාමාන්‍ය පැවිල්ලට ද ජලය බෙදා හැරීමේ කටයුතු සිදු කිරීම ඉතා අපහසු වූ බවත්, මේ නිසා සෞම්‍ය මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට සභාවක් ලෙස අප එකතු වී කමිටු පත් කොට සාකච්ඡා කොට වැඩපිළිවෙළක් සකස් කර ගැනීම සුදුසු වන බවත්, ඒ වගේම අද උදය වන විට ගාල්ල දිස්ත්‍රික්කයත් ඩෙංගු අධිඅවධානම් කලාපයක් බවට පත් කළ බවත්, මහජන පරීක්ෂකවරුන්ගෙන් කළ විමසීමක දී සඳහන් කරන ලද්දේ බෙන්තර ප්‍රදේශයේ ඩෙංගු පැතිරීමක් නොමැති බවත්, පිට පළාත්වලින් ඩෙංගු රෝගය වැළඳුණු පුද්ගලයන් පමණක් අප ප්‍රදේශයේ සිටින බවත්, නමුත් අප ප්‍රදේශයේ ද පැතිරීමේ හැකියාවක් පවතින බැවින් ඒ සඳහා ද කමිටුවක් පත් කොට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු , මහජන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය ආදිය සම්බන්ධ කර ගනිමින් වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු වන බවත්, ඒ වගේම නිශාන්ත මන්ත්‍රීතුමා සඳහන් කළ රජයේ ව්‍යාපෘති සඳහා අප කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ට මෙතෙක් කිසිඳු සහභාගීත්වයකට ඇරයුම් කර නොමැති බවත්, සම්බන්ධීකරණ කමිටුව සඳහා මන්ත්‍රීවරුන් සහභාගීකරවා ගැනීමට නොහැකි බවත්, මීගාර මන්ත්‍රීතුමාට හා මැදගොඩ මන්ත්‍රීතුමාට 1, 2 අවස්ථා ලබා දී එතුමට 3 වන අවස්ථාව ලබා දීමට ඉල්ලුවත් සම්බන්ධීකරණයේ දී 13 වත් නොමැති බවත්, සෞම්‍ය මන්ත්‍රීතුමා වගේම කොඩිතුවක්කු මන්ත්‍රීතුමාට නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා දැනුවත් කොට සම්බන්ධීකරණය සඳහා සභාවේ මන්ත්‍රීවරුන්ට සහභාගී වීමට අවස්ථාව සලසා දීමට කටයුතු කරන මෙන් මතක් කරන බවත්, ඒ වගේම කොහොඹ ගස් වෙන්දේසිය පිළිබඳ මාගේ අප්‍රසාදය ප්‍රකාශ කරන බවත්, වෙන්දේසියක් සිදු කරනවා නම් විනිවිද භාවයෙන් යුක්තව සිදු කළ යුතු බවත්, ඒ සම්බන්ධව සභාව මෙන්ම කොට්ඨාසයේ මන්ත්‍රීවරයා දැනුවත් විය යුතු බවත්, හොරාට කරන වෙන්දේසිවලට අපි එකඟ නැති බවත්, මෙහි දී දූෂණයක් සිදු වූ බවට මාගේ විශ්වාසයක් තිබෙන බවත්, එවැනි දූෂණයක් නොවුණා නම් වෙන්දේසිය පිළිබඳ ප්‍රසිද්ධ කිරීමට තිබුණු බවත්, මා ද නිතර උප කාර්යාලය වෙත යන නමුත් ඒ සම්බන්ධ දැනුවත් කිරීමක් නොකළ බවත්, එවැනි දැනුවත් කිරීමක් ප්‍රසිද්ධ කිරීමක් නොමැතිව සිදු කළ නිසා වංචාවක් දූෂණයක් සිදු වූ බවට මා විශ්වාස කරන බවත්, ඉදිරියේ දී මෙවැනි දෑ සිදු නොවිය යුතු බවටත්, සභාවක් ලෙස සභාපතිතුමාට එවැනි නිලධාරීන් සඳහා ඉදිරියේ දී විනය ක්‍රියාමාර්ග ගෙන කටයුතු කරන ලෙසටත්, එම නිලධාරීන් සඳහා මාගේ දැඩි අප්‍රසාදය මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.35 ට ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>

ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ට රැකියාවට වාර්තා කිරීමට යම් නිශ්චිත වෙලාවක් පවතිනවාදැයි පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත්, ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන් වෛද්‍යතුමිය ප්‍රමාද වී පැමිණෙන බවට පැමිණිලි ඉදිරිපත් කරන බවත්, ඒ හේතුවෙන් ඒ පිළිබඳ සොයා බලන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

වෛද්‍ය නිලධාරීන්ට ද නියමිත වෙලාවක් තිබෙන බවත්, බෙන්තර ආයුර්වේදයේ සිටින වෛද්‍යතුමිය සතියට දින 02 ක් ඉඳුරුව ආයුර්වේදයේ ද කටයුතු කරන බැවින් එම දිනවල බෙන්තර ආයුර්වේදය වසා ඇති බැවින් එම දිනවලට ඉඳුරුව ආයුර්වේදය සඳහා යා යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>

කොහොඹ ගස්වල ගැටලුව සම්බන්ධව නදීෂාන් මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීමට සභාපතිතුමා ආවේගයෙන් කතා කළ ද එතුමා ඒ පිළිබඳ කතා කළේ සද්භාවයෙන් බවත්, අපි ආයතනය සතු දේපළක් වෙන්දේසි කරනවා නම් ඒ සඳහා උපරිමම මිලක් ලබා ගත යුතු බවත්, දෙදෙනෙකුගෙන් පමණක් එය සිදු කිරීම ප්‍රමාණවත් නොවන බවත්, වෙන්දේසියක දී වැඩි පිරිසක් පැමිණීමේ දී වැඩි මිලක් ලබා ගත හැකි වන බවත්, රු. 150,000/- ක පමණ වටිනාකමකින් යුතු ගස් කඳන් රු. 20,500/-ක් වැනි මුදලකට වෙන්දේසි කිරීම පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු කළ යුතු බවත්, සභාවට ලැබීමට තිබූ විශාල ආදායමක් මේ මඟින් අහිමිව ගොස් ඇති බවත්, ඉදිරියේ දී එවැනි දේ සිදු නොවීමට වග බලා ගන්නා ලෙසත්, නොමැති නම් එය සභාවට එතරම් හොඳ තත්ත්වයක නොවන බවත්, සෞම්‍ය මන්ත්‍රීතුමාගෙ කථාවේ දී සම්බන්ධීකරණ කමිටුව කාලය නාස්ති කරන වැඩකට නැති ස්ථානයක් බවට ප්‍රකාශ කළ නමුත් එය ඉතාම වැදගත් තැනක් බවත්, පසුගිය කාලයේ මා විසින් ඉදිරිත් කළ යෝජනා ගණනාවක් ද ඉටු වූ බවත්, ආරච්චිමුල්ල මංසන්ධියේ මඟී මන්තීරුවක් සකස් කර ඇති බවත්, මෙම කමිටු දිනයට පෙර එය ඉටු කරන ලෙස පසුගිය කමිටු වාරයේ දී සඳහන් කළ අතර මේ වන විට එය සකස් කොට ඇති බවත්, අප සභාව මඟින් සිදු කිරීමට නොහැකි බොහෝ කාර්යයන් සම්බන්ධීකරණය හරහා ඉටු කර ගත හැකි වන බවත්, නමුත් සියලුම මන්ත්‍රීවරුන් ඉදිරිපත් වීමේ දී තම කොට්ඨාසයන්වල පවතින ගැටලු පිළිබඳ සඳහන් කළ හැකි බවත්, සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන් ධනාත්මකව සෑම යෝජනාවක්ම ඉටු කිරීමට කටයුතු සලසා දෙන බවත්, එල්නිනෝ සඳහා පුංචි හෝ වැඩපිළිවෙළක් අප විසින් සකස් කළ යුතු බවත්, එල්නිනෝ ආවොත් බෙන්තර ඉවරෙටම ඉවර වෙන බවත්, පසුගිය කාලයේ දී බලපිටිය ජල සම්පාදනයෙන් බෙන්තරට ජලය නොදුන් බවත්, අද වන විට ද ලබා නොදෙන බවත්, නිවසකට ජල සබඳතා ලබා ගැනීමට කළ ඉල්ලීමක දී දුර ප්‍රමාණය වැඩි බව දන්වමින් ජල සබඳතා ලබා දීම නවතා දමා ඇති බවත්, මේ හේතුවෙන් දුප්පත්, අහිංසක, වයෝවෘද්ධ මිනිසුන් තිදෙනෙක් ජීවත් වන නිවසකට ජල සබඳතා ලබා ගත නොහැකිව පවතින බවත්, සභාවෙන් රු. 50,000/- ක මුදලක් ද මේ සඳහා වෙන්කළ බවත්, එය පොදු වැඩක් වන නමුත් ඒ ෆයිල් එක පවා දුර වැඩි බව පවසා පැත්තකට කර ඇති බවත්, දුර වැඩි නම් දුර අඩු කරලා ගේට්ටුව ගාවට බටය දාලා ඒ මිනිස්සුන්ට වතුර දෙන්න කටයුතු කළ යුතු වන බවත්, මානුෂීයත්වයක් නැති නිලධාරීන් සම්බන්ධීකරණ කමිටුවේ දී එවැනි තීරණ ගෙන අවසන් වීම පිළිබඳ කණගාටු වන බවත්, ඒ වගේම එල්නිනෝ තත්ත්වයට මුහුණ දීම සඳහා පැරණි ළිං සුද්ධ කොට නැවත ලබා ගත යුතු බවත්, ආරච්චිමුල්ලේ ළිඳ පිරිසිදු කිරීම ඉතාම වටින බවත්, එය තව තවත් සංවර්ධනය කිරීමට අවශ්‍ය බවත්, ප්‍රංශයේ මේ වන විට අධික රස්නය හේතුවෙන් දහස් ගණනක් මිය ගොස් තිබෙන බවත්, ඒ නිසා ඒ පිළිබඳ වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවත්, ඩෙංගු ගැන සාකච්ඡා කිරීමේ දී කහඹිලියාකන්ද කිසිම ආයතනයකට අයත් නොවන ස්ථානයක් බවත්, බස් නැවතුම අසල කාණුවෙන් මදුරුවෝ සිරි සිරි හඬින් පිටව යන බවත්, මේ සම්බන්ධව ඩෙංගු අංකයට ද කතා කර දැනුම් දුන් බවත්, මාර්ග සංවර්ධන අධිකාරියට ද දැනුම් දුන් බවත්, කිසිවෙකු මෙතෙක් නොපැමිණි බවත්, මේ කොටස් අයිති ආයතනයක් ඉදිරිපත් නොවන බවත්, පොලිසිය හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් නිවාස 75ක් පමණ පරීක්ෂා කොට නිවාස 17 කට පමණ නඩු දමා තිබූ බවත්, තවත් පිරිසකට රතු නිවේදන ලබා දී තිබූ බවත්, කහඹිලියාකන්ද යනු මඟීන් විශාල පිරිසක් කොළඹ ආදී දුර ප්‍රදේශ වෙත යාම සඳහා රැඳී සිටින ස්ථානය වන බවත්, මේ තත්ත්වය හමුවේ ඔවුන්ට අතරමඟ දී ඩෙංගු හදාගෙන කොළඹට යාමට සිදුවන බවත්, අපි හැමදාම බෝලේ පාස් කර කර අරයට අයිතියි මෙයාට අයිතියි කිය කිය සිටින නමුත් මදුරුවා එතන හොඳින් වැඩෙමින් පවතින බවත්, මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ව ද දැනුවත් කළ බවත්, ඒ වගේම මා විසින් නියෝජනය කරනු ලබන කමිටු තිබුණ ද ඒවායේ ගනු ලබන සමහර තීන්දු තීරණ පිළිබඳ දැනුම් දීමක් නොකරන බවත්, පසුගිය සහිත්‍ය උත්සවය ගාමිණී ජාතික පාසලේ පවත්වා විශාල වශයෙන් අර්බුධයකට ලක්වූ බවත්, අපේ සභාවේ මිස්ලට හොඳටම බැනුම් අසන්නට සිදු වූ බවත්, වාහන ඇතුළට යන්න නොදී ඉතාම අපහසුතාවයකට පත් කළ බවත්, ඒ නිසා මෙවර එහි එම

උත්සවය පැවැත්වීම පිළිබඳ හොඳින් සිතා බලන ලෙසත්, වනවාස රජමහා විහාරයේ විහාරාධිපති හිමියන් විසින් එම විහාරය අතීතයේ දී සංදේශ රැගෙන ගිය පක්ෂීන්ට නවාතැන් දුන් පෞරාණික සිද්ධස්ථානයක් නිසා එහි මෙම සාහිත්‍ය උත්සවය පැවැත්වීමට කටයුතු කරන ලෙස ආරාධනාවක් සිදු කළ බවත්, ඒ සඳහා එම හිමියන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවට ප්‍රකාශ කළ බවත්, ඒ සඳහා සහභාගී වන්නන්ගේ ගමන් පහසුව සඳහා බස් රථයක් ද යෙදවීමට කටයුතු කළහැකි බව ද දැන්වූ බවත්, එම විහාරස්ථානයේ පෞරාණික බව ද ආරක්ෂා කරමින් මෙම සාහිත්‍ය උත්සවය එහි පැවැත්වීමට මා ද ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රංජිත් උබේසිංහ මැතිතුමා</u>

අප සභාව වෙත ඉදිරිපත් කරනු ලබන විවිධ වූ මහජන පැමිණිලි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කිරීම සඳහා QR කේත ක්‍රමයක් හඳුන්වා දී තිබූ බවත්, මහජන පැමිණිලි , වීථි ලාම්පු නඩත්තු ඉල්ලීම්, අනවසර ඉදි කිරීම් සම්බන්ධ පැමිණිලි හා පරිසර විෂයට අදාළ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මෙම ක්‍රමවේදය හඳුන්වා දී තිබූ බවත්, නව තාක්ෂණය ඔස්සේ එය ඉතාමත්ම හොඳ වැඩපිළිවෙළක් වන බවත්, මෙය සක්‍රීය කිරීම සඳහා අපගේ පූර්ණ සහයෝගය ලබා දෙන බවත්, ඒ අනුව අප වෙත ලැබෙන පැමිණිලි ද යම් ප්‍රමාණයකින් අඩු වීමට ඉඩ ඇති බවත්, ක්‍රමවත් ආකාරයකට මේ කටයුතු කරගෙන යන ලෙසත්, මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට ලේකම්තුමන්ගෙන් ඉල්ලා සිටින බවත්, ජයරත්න මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි ආරච්චිමුල්ල මංසන්ධියේ මඟී මං තීරුවක් මේ වන විට සකස් කර ඇති බවත්, එය එම ස්ථානයට ඉතාම උචිත වන බවත්, සම්බන්ධීකරණ කමිටුව තුළ යම් දේශපාලනයක් තිබෙන බවත්, ඒ සඳහා ගයන්ත කරුණාතිලක මැතිතුමා ද සහභාගී නොවන බවත්, මන්ත්‍රීවරුන් 23 දෙනාම සහභාගී කරවා ගැනීමට හැකියාව තිබේ නම් එය ඉතා සුදුසු වන නමුත් ඉඩකඩ ගැටලුවක් එහි පවතින බවත්, අවම වශයෙන් කොට්ඨාස 13 හි මන්ත්‍රීවරුන් හෝ සහභාගී කරවා ගැනීමට හැකියාව තිබේ නම් පුද්ගලිකව ඒ පිළිබඳ සතුටු වන බවත්, ඒ වගේම මන්ත්‍රීවරයෙකුගේ විෂය පථය පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ හෝ නිසි ලෙස දක්වා නැති බැවින්, ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කඩිනමින් පවත්වන ලෙසට ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.47 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා</u>

මේ වන විට QR කේත ක්‍රමයක් මහජන පැමිණිලි, අනවසර ඉදි කිරීම්, පරිසර පැමිණිලි හා වීථි ලාම්පුවලට අදාළව හඳුන්වා දී තිබෙන බවත්, QR කේත ස්කෑන් කළ විට ලැබෙන ගූගල් පෝරමය පිරවීමෙන් අදාළ පැමිණිලි අප වෙත ලබා දිය හැකි බවත්, මේ දින කිහිපයට පැමිණිලි 10 කට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබුණ බවත් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

අනතුරුදායක ගස් සම්බන්ධයෙන් මේ මඟින් දැනුම් දිය හැකි දැයි විමසන ලදී.

<u>ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා</u>
එවැනි පැමිණිලි ආයතනය වෙත පැමිණ ආදායම් අංශයට මුදල් ගෙවා සිදු කළ යුතු බවත්, එවැනි පැමිණිලි මාර්ගගත ක්‍රමය ඔස්සේ ලැබුණොත් ඒ පිළිබඳ එම පාර්ශ්වයන් දැනුවත් කිරීමේ හැකියාව පවතින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, රංජිත් උබේසිංහ මැතිතුමා</u>
වීථි ලාම්පු සම්බන්ධ පැමිණිලි ප්‍රදේශයේ මන්ත්‍රීවරයා මඟින් සභාව වෙත දැනුම් දිය යුතු බවට අදහසක් ජනතතාව තුළ තිබෙන බවත්, එවැනි ගැටලු පිළිබඳව මා දැනුවත් කරන ජනතාව මා විසින් ආයතනය වෙත යොමු කරන බවත් සඳහන් කරන ලදී.

<u>ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා</u>
මීට අමතරව දකුණු පළාතේම ක්‍රියාත්මක වන e - Sabha ඇප් එක ද ක්‍රියාත්මක බවත්, ඒ හරහා ද පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉදුරුවගේ ජයරත්න මැතිතුමා</u>
විථි පහන් සම්බන්ධ පැමිණිලි කොට්ඨාස මට්ටමින් වෙන්කර ලේඛනගත කිරීමට කටයුතු සිදු කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.51 කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>
ගාමිණී විද්‍යාලයේ පැවති සාහිත්‍ය උත්සවය පිළිබඳ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස මා ද විදුහල්පතිතුමාගෙන් විමසීමක් කළ බවත්, ගේට්ටුව වැසීම පිළිබඳ ඒ මහතා ප්‍රකාශ කළේ වාහන ඉතා වේගයෙන් පැමිණි නිසා ළමුන්ගේ ආරක්ෂාවට ගේට්ටුව වසා දැමීමට කටයුතු කළ බවත්ය. මේ වන විට විද්‍යාලයේ ප්‍රධාන ශාලාව නවීකරණය කර ඇති බවත්, මෙවර ද එම උත්සවය එම පාසලේ පැවැත්වීම පිළිබඳ විදුහල්පතිතුමා ගේ විරුද්ධත්වයක් නොමැති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
එලෙස වේගයෙන් වාහන ගමන් නොකළ බවත් 252 කැබ් රථය පමණක් එම ස්ථානයට ගිය බවත්, නදීෂාන් මන්ත්‍රීතුමා හෝ වෙනත් මන්ත්‍රීවරයෙකු සමඟ ඇති පුද්ගලික තරහක් මත මෙලෙස කටයුතු කළ බවත්, පුද්ගලික හේතු මත සභාව අපහසුතාවයට පත් කිරීම සිදු නොකළ යුත්තක් වන බවත්, ජාතික කොඩිය ඔසවන ස්ථානයේ තණකොළ ටික පවා කපා දමා නොතිබූ බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**

එම විදුහල්පතිවරයා එදින අප පැවැත්වූ සාහිත්‍ය උත්සවයට සහභාගී නොවී එය වර්ජනය කළ බවත්, සහභාගී වූවන්ට බෙදා දීමට ගෙනා කිරි පැකට් ශාලාව තුළට රැගෙන යාමට පවා ගේට්ටුව ඇර ත්‍රීරෝද රථයට ඉඩ නොදුන් බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>**

ඒ පිළිබඳ එම අවස්ථාවේ දී ම විදුහල්පතිතුමාගෙන් විමසූ විට ලබා දුන් පිළිතුර පමණක් ඉදිරිපත් කළ බවත්, ඒ හැර වෙනත් පවතින ගැටලු පිළිබඳ තමන් නොදන්නා බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

නැවත ඒ පිළිබඳ සාකච්ඡා කිරීම ප්‍රයෝජනයක් නොමැති බවත්, මෙවර සාහිත්‍ය උත්සවය, විවෘත කිරීමක් ද සමඟව සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, මාස 1 ½ ක් වැනි කාලයක් තුළ සාහිත්‍ය උත්සවයක් පැවැත්වීමට හැකි ස්ථානයක ස්ථිර වේදිකාවක් ඉදි කොට විවෘත කිරීමක් ද සමඟින් එය පැවැත්වීමට උත්සාහ කරන බවත්, ජයරත්න මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි වනවාස විහාරාධිපති හිමියන් මා වෙත ද ඉල්ලීමක් සිදු කළ බවත්, ඒ වගේම සාහිත්‍ය උත්සවය කොට්ඨාස 03 ටම ගෙන යාමේ බලාපොරොත්තුවක් ද තිබෙන බවත්, මෙම උත්සවය බෙන්තර පැවැත්වීමේ දී ඊට සහභාගී විය හැක්කේ බෙන්තර අවට ජනතාවට පමණක් වන නිසා මිරිස්වත්ත, රන්තොටුවිල, ඌරගහ ප්‍රදේශවල ජනතාවට යම් අසාධාරණයක් සිදු වන නිසා අවුරුද්දකට වරක් එය කොට්ඨාස 03 හි මාරුවෙන් මාරුවට පැවැත්වීම සුදුසු වන බවත්, පාසල් භූමි තුළ උත්සව පැවැත්වීමේ දී යම් ගැටලුකාරී තත්ත්වයන් මතු වන බවත්, විදුහල්පතිට අදාළ වන්නේ පාසල් භූමිය, ගොඩනැගිල්ල හා සිසුන්ගේ ආරක්ෂාව පමණක් වන බවත්, බාහිර කටයුතු සඳහා පාසල් යොදා ගන්නා විට වර්තමානයේ දැඩි නීති රීති පද්ධතියක් තිබෙන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>**

ආදාහනාගාරයට ගමන් කරන මාර්ගයේ පුවරුව අවුරුද්දයි මාසයක් ගත වී ඇති නමුත් මෙතෙක් සවි කර ගැනීමට නොහැකි වී තිබෙන බවත්, එම මාර්ගයේ වාහන ගමන් කිරීමට නොහැකි වන ලෙස වැට මායිම්වල අතු සියල්ල පාරට බරව පවතින බවත්, ඒ පිළිබඳ මේ කතා කරන අවසන් වතාව වන බවත්, නැවත මතක් කිරීමක් සිදු නොකරන බවත්, තව ද ආදාහනාගාරයට පිවිසෙන ස්ථානයේ පවතින වාහන ගමන් කිරීමේ දී අවහිර වන ගේට්ටු කණුවක් පිළිබඳ පුද්ගලිකව ද ඔබතුමාට පෙන් වූ බවත් එය ද මෙතෙක් ඉවත් කර නොමැති බවත්, ඒ වගේම ලැන්ඩ් සේල්වල ඉඩම් කැබලි වෙන් කිරීමේ දී පොදු කොටසක් ලෙස සභාවට වෙන් කරන කොටසේ මේ වන විට පන්සල් සෑදීමේ ලොකු ප්‍රවණතාවයක් ඇති වෙමින් යන බවත්, පළමුව ඊට අල්ලපු ඉඩමින් පර්චස් 10 ක් 20 ක් පමණ මිල දී ගන්නා බවත්, ඉන් පසුව පොදු ඉඩම් කොටස ද පන්සලට ලබා ගැනීමට ඉල්ලීම් සිදු කරන බවත්, මෙය වැඩි වශයෙන් මාගේ කොට්ඨාසය තුළ සිදු වෙමින් පවතින බවත්, පසුගිය දිනක කන්දෙව්හාරයේ දෙවෙනි හාමුදුරුවෝ කියලා ඇවිත් එවැනි ඉඩම් කොටසක පන්සලක් සෑදීමට සූදානම් වූ බවත්, එම ඉඩමට අල්ලපු ඉඩම මිල දී ගෙන ඇත්තේ සිල් මෑණීන් වහන්සේ නමක් වන බවත්, මාද හොඳ බෞද්ධයෙක් වන නමුත් අඩියෙන් අඩියට පන්සල් ඉදි කිරීම සුදුසු නොවන බවත්, මේ ගැන දැඩි අවධානයකින් කටයුතු කරන ලෙසත්, එවැනි දෑ සඳහා සභාවක් ලෙස ඉඩනොදිය යුතු බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**

අවිධිමත් පරිදි කුණු බැහැර කිරීම් බල ප්‍රදේශය තුළ සිදුවන බවත්, කයිකාවල නාන තටාකය අසල, ගල්තුඩුව වේල්ල හා තුන්දූව වේල්ල ආදී ස්ථානවල පොරබෑග්වල පුරවලා ගැටගහලා වීසි කර යන බවත්, මේ ස්ථානවල විශාල වශයෙන් කුණු එකතු වී තිබෙන බවත්, විශේෂයෙන් නාන තටාකය අසල ප්ලාස්ටික් බෝතල් බොහොමයක් තිබෙන බවත්, මේවා සියල්ල එක මොහොතක ඉවත් කරන්නට වැඩපිළිවෙළක් සකස් කිරීමට හැකි නම් ඉන්පසු සභාවේ අධීක්ෂණය යටතේ යම් ශක්තිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු බවත්, එසේ නොමැතිව මෙය වැළැක්වීම අපහසු බවත්, ඒ වාගේම විදුලි පහන් සම්බන්ධයෙන් ගත් විට ඒවා නැවත නිවා දමන්නේ නැතිනම් බල්බ දැමීමෙන් වැඩක් නොමැති බවත්, දවස පුරාම විදුලි බල්බ දැල්වී තිබෙන බවත්, මේ සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් නොමැති බවත්, වරක් ඔබතුමා එවැනි බල්බ ගලවා ඉවත් කරන බවට ප්‍රකාශ කළ බවත්, කඩිනම් වැඩපිළිවෙළක් ඒ සඳහා ඇති කළ යුතු බවත්, නැතිනම් ජාතික ආර්ථිකයට කරන බරපතල අපරාධයක් වන බවත්, සම්බන්ධීකරණ කමිටුව සඳහා සහභාගී වීමේ ගැටලුව මටවත් නිශාන්ත පෙරේරා මැතිතුමාටවත් විසඳිය හැකි දෙයක් නොවන බවත්, චක්‍රලේඛයක් හරහා පැමිණි දෙයක් බවත්, අපිත් ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන බවත්, බෙන්තරට විතරක් එය විශේෂයක් බවට පත් වී තිබෙන බවත්, ප්‍රාදේශීය ලේකම්තුමා හරහා මේ සම්බන්ධව යම් ඉල්ලීමක් සිදු කරන ලෙස ඉල්ලා සිටින බවත්, ඒ වගේම අතීතයේ ප්‍රාදේශීය සභාවේ සේවක කණ්ඩායමක් පාරවල්වල තිබෙන කුණු ඉවත් කිරීම් සිදු කිරීමට සිටි බවත්, පසුගිය දිනක කොටුවබැන්දහේන ප්‍රදේශයේ වැඩසටහනකට සහභාගී වූ බවත්, ඒ සඳහා යාමේ දී එම ප්‍රදේශය දෙපස වල් බිහි වී තිබූ බවත්, එම ප්‍රදේවාසීන්ට ද ඒවා එළිපෙහෙළි කිරීමේ අවශ්‍යතාවයක් දක්නට නොලැබුණ බවත්, ප්‍රජාවගේ පැත්තෙන් ඔවුන්ටත් යම් අසාධාරණයක් සිදු වන නමුත් කම්කරුවන් ප්‍රමාණවත් නොවීමේ ගැටලුව ද ඇති නමුත් ඉදිරියේ දී නැවත පෙර පරිදි එවැනි කණ්ඩායමක් සකස් කර ගැනීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය**

කල් නොදුන් යෝජනා යටතේ සේරසිංහ මන්ත්‍රීතුමා ද සිංහරුපාගම කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, පවතින ඩෙංගු උවදුර හමුවේ බෙන්තර බල ප්‍රදේශයේ බොහෝ ප්‍රදේශවල PHI මහත්වරුන් ගොස් පරීක්ෂා කිරීම් සිදු කර තිබූ බවත්, එම පරීක්ෂා කිරීම්වල දී පුද්ගලිකව අප සම්බන්ධ කරගෙන අර කාණුව සුද්ධ කරලා නෑ මේ කාණුව සුද්ධ කරලා නෑ අතන කුණු තියෙනවා මෙතන කුණු තියෙනවා කියලා දැනුම් දෙන බවත්, මහජනතාවගේ පැත්ත අප නියෝජනය කළ ද කණගාටුවෙන් වුවත් පහුගිය දිනවල ආදාහනාගාරය අසල ලොකු කුණු බෑග් වගයක් දමා ගොස් තිබූ බව සඳහන් කළ යුතු බවත්, ඒවායේ පැම්පස් හා සස්ටජන් ටින් වගයක් තිබූ බවත්, PHI මහත්වරුන් විසින් අතන කුණු තියෙනවා මෙතන කුණු තියෙනවා සභාවෙන් අරන් ගිහින් නෑ කියලා දැනුම් දෙන බවත්, සභාව ලෙස අප පැම්පස් එකතු නොකරන බවට ජනතාව දැනුවත් කර ඇති නමුත් එම ස්ථානයේ විශාල පැම්පස් බෑග් 03 ක් පාර පුරා විසිරී තිබූ බවත්, මහජනතාවගේ පැත්තෙන් සිදු කරන මෙවැනි ක්‍රියා පිළිබඳ කණගාටු වන බවත්, එක් වරක් කාණු සුද්ධ කර දුන් පසු එය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට කටයුතු නොකරන බවත්, නැවත එය මතක් වන්නේ ඩෙංගු උවදුර ව්‍යාප්ත වන විට බවත්, උප සභාපතිතුමා සඳහන් කළ ආකාරයට ඩෙංගු වසංගත තත්ත්වයක් බවට මේ වන විට පත්ව ඇති නිසා කඩිනමින් වැඩපිළිවෙළක් යෙදීම සුදුසු වන බවත්, පසුගිය සභා කාලවල දී සිදු කළා සේ දුම් ගැසීම වැනි දේ සිදු කළ හැකි බවත්, ජලය ගලා නොයන කාණු පද්ධති බොහොමයක් ද තිබෙන බවත් සඳහන් කරන ලදී.

**ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය**

කුණු සම්බන්ධයෙන් කතා කළ විට මේ වන විට නෙළුම්පොකුණගම කුණු වලින් පිරී ඉතිරී ගොස් ඇති බවත්, සුනාමිවලින් අවතැන් වූ පිරිස් නෙළුම්පොකුණගමේ පදිංචි කළ බවත්, ඒ අයට කුණු බැහැර කිරීමට

ස්ථානයක් නොමැති බැවින් ගමට මදක් ඔබ්බෙන් පිහිටි ළඳු කැළෑ ප්‍රදේශයට කුණු බැහැර කිරීම නිසා මේ වන විට නෙළුම්පොකුණ ඇළ මාර්ගය අවහිර වී ඇති බවත්, පසුගිය දිනක STF එක මඟින් එම ස්ථානයට කුණු දැමීමට පැමිණි අයෙකු අල්ලා ගත් බවත්, මේ වන විට එම ප්‍රදේශයේ කුණු බැහැර කිරීම ඉතාම ගැටලුකාරී තත්ත්වයක් බවට පත්ව ඇති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

තුන්දුව ප්‍රදේශයට බස් රථ තිබෙන්නේ ඉතාම අඩු ප්‍රමාණයක් බවත්, බොහෝ පිරිසක් පයින් ගමන් කරන බවත්, කොට්ටම්බා ගහ හන්දියේ සිට තනිකර පාර පුරා පැම්පස් දමා ගොස් තිබෙන බවත්, එම කොටස පසුගිය කාලයේ ජනතාව ශරීර සුවතා සිදු කිරීමට නිතර භාවිත කළ බවත්, සභාව මඟින් පාර දිගට විදුලි ආලෝකය ද සපයා ඇති බවත්, මේ වන විට ඉතාම අප්‍රසන්න මට්ටමක මාර්ගය පවතින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පිළිසකර කිරීමේ දී තණකොළ කපන විට ඒ අය මැෂින්වලින්ම තණකොළ පැත්තකට අයින් කරන නමුත් එතන තියෙන බෝතලය, ප්ලාස්ටික් කැබැල්ල, පොලිතින් කවරය ඉවත් නොකරන බවත්, ඒ පිළිබඳ අද දින සම්බන්ධීකරණ කමිටුව සඳහා සහභාගී වන මන්ත්‍රීවරුන් අදහස් දැක්වීමට කටයුතු කරන ලෙසත්, ඒ වගේම මීට ඉහත මා සම්බන්ධීකරණ කමිටුව නොවැදගත් ලෙස සලකා අදහස් දැක්වීමක් සිදු නොකළ බවත්, සමහර මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන යෝජනා කමිටුවේ කතා බහ කොට විසඳුමක් ලබා ගැනීමට තරම් අවශ්‍ය නොවන සුළු සුළු යෝජනා බව පමණක් අදහස් කළ බවත්, ඒ හේතුවෙන් එවැනි යෝජනා ඉදිරිපත් කිරීමෙන් කාලය වැය වීම පිළිබඳව පමණක් අදහස් කළ බවත්, නිශාන්ත පෙරේරා මැතිතුමා වසර ගනණාවක් දේශපාලනයේ යෙදී සිටි අයෙකු බවත්, රජය කුමන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ ද එතුමාට හැකි පමණින් මෙම ප්‍රදේශය සඳහා යම් කාර්යයක් ඉටු කිරීමට උත්සාහ ගන්නා නම්‍යශීලීත්වයකින් යුතු ඒ කාරණා පිළිබඳ මැදිහත් වීමක් සිදු කරනු ලබන කෙනෙක් වීම පිළිබඳ සතුටු වන බවත්, නමුත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්ලාස්ටික් හා පොලිතීන් එකතු නොකරන බවට කෙළින්ම ප්‍රකාශ කළ අවස්ථාවේ නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා දැක්වූ ප්‍රතිචාරය පිළිබඳ සෑහීමකට පත් නොවන බවත්, පෙර සිටි නිශාන්ත මන්ත්‍රීතුමා එවැනි අයෙකු නොවන බවත්, එවැනි අවස්ථාවක ඒ පිළිබඳ විවාද සිදු කරන බවත්, ටෙලිකොම් රැහැන් කණු පිළිබඳ ගැටලුවේ දී ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි බවත්, නමුත් එවැනි ලේඛනයක් අවශ්‍ය නොවන බවත්, ආරච්චිමුල්ල හන්දියේ සිට දිගටම තිබෙන දුරකතන රැහැන් කණු කාපට් මාර්ගයේ සිට අඩි 03 ක් ඉක්මවා නොමැති බවත්, සම්බන්ධීකරණ කමිටුව සඳහා සහභාගී වීම සම්බන්ධයෙන් කොඩිතුවක්කු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි නිකුත් කර ඇති චක්‍රලේඛයේ ගැටලුව පවතින බවත්, මන්ත්‍රීතුමන්ලා සමඟ ඒ පිළිබඳ ගැටලුවක් නොමැති බවත්, නමුත් මන්ත්‍රීවරු 24 දෙනා සිටි කාලයේ ද සියලුම දෙනා ඒ සඳහා සහභාගී වූ බව ද මතක් කරන බවත්, කොහොඹ ගස් සම්බන්ධයෙන් වෙන්දේසියේ දී වංචාවක් සිදු වූ බවට හැඟෙන බවත්, පරිසර නිලධාරීතුමිය විසින් මෙය ඉවත් කර ගත යුතු ගසක් බවට නිවේදනයක් නිකුත් කළ යුතු වන බවත්, මාර්ගයට බරව පවතින අනතුරුදායක ගසක් ඉවත් කිරීමේ යම් ක්‍රමවේදයක් පවතින බවත්, වසරකට අධික කාලයක් මෙම සභාවේ සභාපති ධුරය දැරූ ඔබතුමාගේ නායකත්වය මත අප කටයුතු කරගෙන යන බවත්, මෙතෙක් කිසිඳු අපකීර්තියකට පත්ව නැති බවත්, ප්‍රේමකුමාර විජේවර්ධන ලෙස ඔබතුමාගේ කීර්ති නාමය මෙන්ම අපගේ ද සභාවේ ද කීර්ති නාමය ආරක්ෂා වන ලෙස කටයුතු කරන ලෙසත්, එම නිලධාරීන් පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලෙසත්, ඔබතුමාගේ කාලයේ දී එවැනි දෑ සිදු නොවන විශ්වාසයෙන් අප ඔබතුමා සමඟ කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

සම්බන්ධීකරණයට සහභාගී වීම පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් මීට පෙර ප්‍රාදේශීය ලේකම්තුමාට මෙන්ම දිස්ත්‍රික් ලේකම්තුමාට මේ සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම් ද සමඟ ලිපි යොමු කර ඇති බවත්, මෙහි ඇත්තේ වෙනත් හේතුවක් වන බවත්, මා සභාපති ධුරය නොදරා මන්ත්‍රී ධුරය පමණක් දැරුවේ නම් මේ සම්බන්ධව මා ගන්නා ක්‍රියාමාර්ගය වෙනස් වන බවත්, මේ ක්‍රමවේදයට මම විරුද්ධ වන අවස්තාවක් පැමිණෙන බවත්, එදාට ඔබ සියලු දෙනා මා ඉදිරියේ සිට ගනු ඇතැයි මා විශ්වාස කරන බවත්, ග්‍රාමීය කමිටුවේ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම මෙහි යටි අරමුණ වන බවත්, දෙවනුව ඔබතුමන්ලා විසින් විමසන ලද සාහිත්‍ය උත්සවය මෙම වසරේ ද ගාමිණී විද්‍යාලයේ පවත්වා විදුහල්පතිතුමන් සමඟ ගැටලු ඇති කර ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බවත්, ඒ වගේම කුණු සම්බන්ධව කතා කළ විට සෑම ප්‍රදේශයකම තිබෙන කුණු ගෙන ඒමට මාගේ විරුද්ධත්වයක් නැති නමුත් කුණු රැගෙන විත් දැමීමට ස්ථානයක් නොමැති වීම ගැටලුවක්ව බවතින බවත්, මේ දිනවල කසල වෙන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, පෙර සභා කාලවල්වලට වඩා පාසල්, පන්සල් සභාවේ ශ්‍රම දායකත්වය ලබා ගැනීමට කටයුතු කරන බවත්, පන්සල්වල දායක කමිටු තිබිය දී සභා සේවකයන් මඟින් පිරිසිදු කිරීම් සිදු කර ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, ගල් තුඩුව වේල්ලේ කුණු කසල ඉවත් කර, මී ගස් සිටුවා කසල දැමීම තහනම් ලෙස පුවරු ද සවි කළ නමුත්, එම පුවරු අසලට කුණු මලු දමා යන බවත්, උගත් බුද්ධිමත් යැයි සැලකෙන සුඛෝපභෝගී ජීවිත ගත කරන අය විසින් මෙලෙස කටයුතු කරන බවත්, සාමාන්‍ය මට්ටමේ හා දුප්පත් ලෙස ජීවිත ගත කරන අය මෙවැනි දෑ භාවිත කිරීමට මුදල් වැය නොකරන බවත්, මීළඟට ඩෙංගු උවදුර සම්බන්ධව ගත් විට බල ප්‍රදේශයේ පළමු පුරවැසියා මා වන නමුත් ඩෙංගු මර්ධනය සඳහා සම්බන්ධීකරණය හරහා සිදු කරනු ලබන කිසිම කමිටුවකට, සාකච්ඡාවකට, වැඩසටහනකට මා වෙත මෙතෙක් ආරාධනා ලැබී නොමැති බවත්, එසේම පසුගිය දිනක විහාරස්ථානයක පවත්වන්නට යෙදුණු ආගමික උත්සවයක් සඳහා සභාපතිවරයා ලෙස මා හට ආරාධනා නොකළ යුතු බව සංවිධායක මණ්ඩලය විසින් තීන්දු කොට තිබූ බවට මා නොදැන සිටි බවත්, නමුත් හදිසියේ එම උත්සවයට මා හට ආරාධනා නොකරන ලෙස සාකච්ඡාවක් පැවති බව තාරක මන්ත්‍රීතුමා මා දැනුවත් කිරීම සම්බන්ධව මාගේ ස්තූතිය පුද කරන බවත්, එහෙත් නදීෂාන් මන්ත්‍රීතුමා අදාළ උත්සවය සඳහා මාර්ග එළිපෙහෙළි කිරීම්, ජලය ලබා ගැනීම්, ප්‍රචාරක රථ ලබා ගැනීම් ආදී සියල්ල මා දැනුවත් කොට ලබා ගත් නමුදු ඉහත කාරණය සම්බන්ධව ඔහු මුනිවත රැකීම ප්‍රේමකුමාර ලෙස මා නොව සභාපතිවරයා කියන තනතුර හෑල්ලු කිරීමක් ලෙස සඳහන් කරන බවත්, එසේම ආරාධනා නොකළ කිසිම රැස්වීමකට හෝ උත්සවයකට සහභාගී වීමට මා හට කිසිදු උවමනාවක් නොමැති බවත්, එහෙත් සභාපතිවරයා ලෙස සභාවේ ගෞරවය පමණක් නොව මන්ත්‍රීවරු ලෙස ඔබගේ ගෞරවය ද ආරක්ෂා කිරීම මාගේ වගකීම වන බවත් සඳහන් කරන ලදී.

**8.3. <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම</u>**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපි ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-</u>**

මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 17 දෙනාට ස්තුතිවන්ත වන බව පවසමින් ගරු සභාපතිතුමා විසින් සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ප.ව. 12.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

.............................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,

සභාපති,

බෙන්තොට ප්‍රාදේශීය සභාව.

**<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 ජුලි මස මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>**

**<u>සංශෝධන අංක 01 - ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන:-</u>**

පසුගිය සභා වාර්තාවේ 12 වෙනි පිටුවේ මාගේ අදහස් දැක්වීම යටතේ සඳහන් වූ ''කෙටි කාලයක්'' යන්න ''මසක කාලයක්'' ලෙස සංශෝධනය විය යුතුයි.

......................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,

සභාපති,

බෙන්තොට ප්‍රාදේශීය සභාව.